# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,876 - 2014 අගෝස්තු මස 15 වැනි සිකුරාදා - 2014.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1370 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1397 |


*සැ. යු.*- පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2014 අගෝස්තු මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 සැප්තැම්බර් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අගෝස්තු මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. ඩී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1367- B 80865—2,875 (2014/08)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල කාති තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සුදුසුකම් ඇති පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුක්තිකයෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරුවන් වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙක් විය යුතු ය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත්කරනු ලැබේ.

කාතිවරයෙකු තමා පත්කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචි වී සිටීම නීතිමය වශයෙන් අවශ්‍ය වේ.

කාතිවරයාට මසකට රුපියල් 6,000ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 5,000 ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන් කර 2014 සැප්තැම්බර් මස 14 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් සමඟ ලිපි ලේඛනාදියෙහි මුල් පිටපත් එවිය යුතු නොවේ.

ඩබ්ලිව්. කේ. ඩී. විජේරත්න,<br>
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>
අධිකරණ සේවා කොමිෂන්<br>
සභාවේ ලේකම් වෙනුවට.

2014 ජුලි මස 22 වැනි දින.<br>
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,<br>
තැ. පෙ. 573,<br>
කොළඹ 12.

### උපලේඛනය

1. හම්බන්තොට - හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. කොළඹ බටහිර - කොළඹ අධිකරණ කලාපයේ, දෙහිවල, ගල්කිස්ස, රත්මලාන, නුගේගොඩ, පැපිලියාන, මහරගම, පන්නිපිටිය, හෝමාගම, පොල්ගස්ඕවිට, ඉංගිරිය, රාජගිරිය, බත්තරමුල්ල සහ අතුරුගිරිය යන ප්‍රදේශවල කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

3. අකුරණ - මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

***1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය යටතේ) ……… ප්‍රදේශය සඳහා ක්වාසිවරයෙකු පත්කිරීමේ ඉල්ලුම්පත්‍රය***

1. සම්පූර්ණ නම :

2. මුලකුරු සමග නම :

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය :

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා. හැ. ප. අංකය :

10. දුරකථන අංකය :

11. අධ්‍යාපන සුදුසුකම් :

12. වෘත්තීය සුදුසුකම් :

13. ඉල්ලුම්කරුට කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :

14. ඉල්ලුම්කරුට මුස්ලිම් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද ? :

15. විවාහක ද ? :

16. ඔබ නීතිඥවරයෙක් ද? එසේ නම් බඳවාගන්නා ලද දිනය :

17. ඉහත දී කරන ලද සහ දැනට කරන රැකියා (දිනත් සමග) :

| සිට | දක්වා | රැකියාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

18. ඉල්ලුම්කරු සතු දේපළ වටිනාකම : රු.

19. මාසික ආදායම : රු.

20. කොපමණ ණය ගැතිද ? ඇතොත් : රු.

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද ? :

22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද ? :

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුණේ ද ? තිබේ ද ? :

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය : (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිව යුතු පුද්ගලයන් විය යුතු ය) :

| (1) | (2) |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| රක්ෂාව : | රක්ෂාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : |

මෙම අයදුම්පතෙහි මාවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

______________,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :——————.

*සටහන :*

සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

08-476

---

**උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය**

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවෙහි උද්‍යානවල පුරප්පාඩුවී පවතින ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL-2) සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම**

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පවතින උද්භිද උද්‍යාන සඳහා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු සහ රැකියාවේ ස්වභාවය

| *අනු. අංක* | *තනතුර* | *මූලික කාර්යයන්* |
|---|---|---|
| 01 | බංගලා භාරකරු | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සතුව ඇති සංචාරක බංගලා ප්‍රියමනාප අයුරින් පවත්වාගෙන යාම, අමුත්තන්ගේ ආහාරපාන පිළියෙළ කිරීම හා ආදායම් වියදම් ගිණුම්ගත කිරීම. |
| 02 | පෙදරේරු | අනුමත සැලසුම් හා ඇස්තමේන්තු ප්‍රකාර පෙදරේරු විෂයට අයත් ඉදිකිරීම්, අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කිරීම, |
| 03 | වඩුකරු | වඩුවැඩ විෂයට අයත් ඉදිකිරීම්, අලුත්වැඩියා හා නඩත්තු කටයුතු නියමිත ප්‍රමිතියට අනුව සිදු කිරීම, |
| 04 | මෝටර් කාර්මික | දෙපාර්තමේන්තුවට අයත් සියලුම වාහන හා ඉන්ධන භාවිතයෙන් ක්‍රියාකරන යන්ත්‍රෝපකරණවල අළුත්වැඩියා කටයුතු සම්බන්ධව පරීක්‍ෂා කර වාර්තා කිරීම, සහාය වීම හා අවශ්‍ය අළුත්වැඩියාවන් සිදුකිරීම; |
| 05 | විදුලි කාර්මික | දෙපාර්තමේන්තුවට අදාළ කාර්යාල ගොඩනැගිලි, නිල නිවාස ආදියෙහි එකලා/තෙකලා විදුලි පද්ධතිවලට අදාළ සියලුම කටයුතු, |
| 06 | බද්ධකරු | පැළ තවාන්වල ඇති විශේෂිත වූ විසිතුරු පැළ, මල් පැළ හා වෙනත් පැළෑටි බද්ධ කිරීමේ සියලු කටයුතු හා නව ක්‍රම උපායන් පිළිබඳ අත්හදා බැලීම. |
| 07 | ලේබල්කරු | උද්‍යානය තුළ ශාක හා ස්ථාන හැඳින්වීම සඳහා නාම පුවරු ත්‍රෛභාෂාවෙන් සකස් කිරීම, ඒ හා සම්බන්ධ අනෙකුත් සියලු කටයුතු සිදු කිරීම හා පුවරු යාවත්කාලීන කිරීම. |

පුරප්පාඩු පවත්නා දිස්ත්‍රික්ක - හම්බන්තොට, කොළඹ, ගම්පහ, මහනුවර, නුවරඑළිය

02 *සේවා කොන්දේසි*.-තෝරාගනු ලබන අයදුම්කරුවන් පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සේවා ගණයේ III වැනි ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය;

(ii) පත්වීම් ලැබූ දින සිට වසර 3ක පරිවාස කාලයකට යටත් වේ.

(iii) තෝරා ගනු ලබන නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, වෙනත් රජයේ චක්‍රලේඛ හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති යටතේ දැනට පවත්නා හා ඉදිරියේදී වන සංශෝධන ඇතුළත් නීති රීති, ව්‍යවස්ථා සහ විධිවිධානවලට යටත්ව කටයුතු කළ යුතුවේ.

(iv) III ශ්‍රේණිය සඳහා පත්කරන ලද දින සිට වසර 3ක් ඇතුළත I වැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

(v) එසේම 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

(vi) සේවා අවශ්‍යතාව පරිදි දෙපාර්තමේන්තුවේ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට එකඟ විය යුතුය.

03. *වැටුප් බණ්ඩය හා පරිමාණය :*

(i) වැටුප් බණ්ඩය - PL- 02 - 2006A
(ii) වැටුප් පරිමාණය -රු. 12,210-10x130-10x145-10x160-12x170-රු. 18,600/- (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (iv) අනුකූලව)

04. *සුදුසුකම් :*

04.1 (i) අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක්

සහිතව විෂයයන් හයක් සමත්වී තිබීම.

(ii) වෘත්තීය සුදුසුකම් : අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි අදාළ ක්ෂේත්‍රයෙහි හෝ ඊට ආසන්න ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ හෝ ඊට සමාන නිපුණතාවයක් ලබා ගෙන තිබීම (ලිඛිත සහතික මඟින් සනාථ විය යුතුය.)

(iii) පළපුරුද්ද : ඉල්ලුම් කරන තනතුරට අදාළ කාර්යයන් පිළිබඳ අවම වශයෙන් අවුරුදු 03ක සේවා පළපුරුද්දක් තිබීම. (පළපුරුද්ද පිළිබඳ තොරතුරු ලිඛිත සහතික මඟින් සනාථ කළ යුතුය.)

04.2 *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය;

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය;

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන ඉහත අනු අංක 4.1 (i) සුදුසුකම් හා අනු අංක 4.1. (ii) යටතේ සඳහන් සුදුසුකම් මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අයදුම්පත් කැඳවා අවසාන වන දිනට සෑම අයුරකින්ම සම්පූර්ණ කළ යුතුය.;

(iv) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් වන කායික හා මානසික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු අතර රජයේ වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය;

(v) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට වැඩි නොවිය යුතුය. (දැනටමත් රජයේ ස්ථිර සේවයේ යෙදෙන නිලධාරීන් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ).

05. *අයදුම් කිරීමේ පිළිවෙළ :*

මෙම දැන්වීමේ සඳහන් ආකෘතියට අනුව A4 (8 1/2'' x 12'') ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත් සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය අධ්‍යක්ෂ ජනරාල් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, තැ. පෙ. 14, පේරාදෙණිය යන ලිපිනයට 2014 සැප්තැම්බර් මස 05 දා හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහාලු ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. තනතුරු එකකට වඩා වැඩි ගණනකට ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

06. *තෝරා ගැනීමේ ක්‍රමවේදය.*— ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය පරීක්ෂණයක් මගිනි.

07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී අතිරේක අධ්‍යාපන සුදුසුකම්, අතිරේක පළපුරුද්ද, අතිරේක වෘත්තීය සුදුසුකම්, භාෂා ප්‍රවීණතාවය සහ සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය යන ක්ෂේත්‍ර සඳහා ලකුණු ලබා දෙනු ලබන අතර ඒ ඒ තනතුරට අදාළ කාර්යයන්හි ප්‍රායෝගික හැකියාවන් වෘත්තීය පරීක්ෂණයේදී පරීක්ෂා කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සහ සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමේ බලය සහ බඳවා ගැනීම් සම්බන්ධව අවසන් තීරණය අධ්‍යක්ෂ ජනරාල් ජාතික උද්භිද උද්‍යාන සතු වනු ඇත.

ආචාර්ය ඩී. එස්. ඒ. විජේසුන්දර,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.

2014 ජූලි මස 30 වැනි දින.

*උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය*

*ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව*

*ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL-2) සේවා ගණයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය*

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. ඔබ විසින් අයදුම්කරන තනතුර ඉදිරියෙන් (✓) ලකුණ යොදන්න.

(තනතුරු එකකට වැඩිගණනක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් වෙනම අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුවේ.)

| | |
|---|---|
| 1. බංගලාභාරකරු | |
| 2. පෙදරේරු | |
| 3. වඩුකරු | |
| 4. මෝටර් කාර්මික | |
| 5. විදුලි කාර්මික | |
| 6. බද්ධකරු | |
| 7. ලේබල්කරු | |

02. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(මහතා/මහත්මිය/මෙනෙවිය)

03. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. ස්ථිර ලිපිනය :————.

06. තැපැල් ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

07. 7.1 උපන් දිනය :————.

7.2 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : ☐ මාස : ☐ දින : ☐

08. ස්ත්‍රී/පුරුෂ භාවය :

1 - ස්ත්‍රී 2 - පුරුෂ ☐

09. විවාහක/අවිවාහක භාවය :

1 - විවාහක, 2 - අවිවාහක

10. සම්මුඛ/වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටින මාධ්‍යය :

(සිංහල - 1, දෙමළ - 2, ඉංග්‍රීසි - 3)

11. දුරකථන අංකය :————.

12. සුදුසුකම් :

12.1 අධ්‍යාපන සුදුසුකම් .—

පළමුවර පෙනී සිටීම
අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාග තොරතුරු :

* විභාගයට පෙනී සිටි වර්ෂය හා මාධ්‍යය :————.
* විභාග අංකය :————.
* විභාග ප්‍රතිඵල :

| *විෂය* | *සාමාර්ථය* | | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|
| 1. | | | 6. | |
| 2. | | | 7. | |
| 3. | | | 8. | |
| 4. | | | 9. | |
| 5. | | | 10. | |

(දෙවන වර සමත් අයදුම්කරුවන් පමණක් මෙම ආකෘතිය අනුව එම ප්‍රතිඵලද සඳහන් කරන්න.)

12.2 වෘත්තීය සුදුසුකම් :—

* ලබා ඇති වෘත්තීය සුදුසුකම :————.
* කාල සීමාව :————.
* එය සම්පූර්ණ කළ දිනය :————.
* අදාළ ආයතනය :————.

12.3 වෙනත් සුදුසුකම් :————.

12.4 පළපුරුද්ද :————.

(රැකියාවේ ස්වභාවය, කාල සීමාව, ආයතනය පිළිබඳ තොරතුරු සඳහන් කරන්න.)

13. *දැනට රජයේ ස්ථිර සේවයේ නිලධාරීන් සඳහා :*

13.1 දැනට දරන තනතුර හා ශ්‍රේණිය :————.

13.2 සේවා ස්ථානය :————.

13.3 පළමු පත්වීම් දිනය :————.

13.4 පූර්වාසන්න වසර 5 තුළ,

(I) විනය චෝදනාවන්ට ලක්ව ඇති/නැති බව
(II) වැටුප් රහිත නිවාඩු ලබා ඇති/නැති බව

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද, මා රාජ්‍ය සේවයේ තනතුරකින් පහ කරන ලද හෝ තනතුරක් හැරගිය පුද්ගලයෙකු නොවන බව ද ප්‍රකාශ කර සිටිමි. තව ද, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් පනවනු ලබන නීති හා රෙගුලාසිවලට එකඟ වන අතර, මෙම තනතුරෙහි පත්වීම සහ රාජකාරී ස්ථානය පිළිබඳ සියලු තීරණ ගැනීමේ අයිතිය එම අධ්‍යක්ෂ ජනරාල් සතුව පවතින බව ද පිළිගනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා :*

14. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු වන ...................... මහතා/ මහත්මිය/ මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ........... (ස්ථිර/තාවකාලික) නිලධාරියෙක් බව ද, ඔහුට/ඇයට උක්ත පත්වීමේ රාජකාරිය ඉටු කිරීමට හැකියාව ඇති/නොමැති බව ද, සඳහන් කරමි. යම් හෙයකින් එම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකියාව ඇති බව ද සඳහන් කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

08-559

---

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම් කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2014.10.15 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය :*

රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2,160 - 17 x 2,880 - රු. 2,54,100

තව ද මෙම නිලධාරීන් අනෙකුත් රජයේ නිලධාරීන්ට හිමිවන ජීවන වියදම් දීමනාව සහ අංක 31/11 සහ 2011.12.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ලබාදී ඇති දීමනාවට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ.

(අ) දුෂ්කර දීමනා : රු. 2,000

(ආ) *සංයුක්ත දීමනා :*
(1) උතුරු සහ නැගෙනහිර සේවය සඳහා රු. 10,500
(2) අනෙකුත් ප්‍රදේශවල සේවය සඳහා රු. 8,400

(ඇ) නොමිලේ ගමන් පහසුකම්,

(ඈ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(ඉ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඊ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(උ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම් :*

(අ) *වයස් සීමාව :*
*ගැසට් නිවේදනය අනුව* අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන 2014.10.15 දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය. එසේ වුව ද දැනට පොලිස් ආරක්ෂක සහයක සේවාවේ නියුතු නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

(ආ) *අධ්‍යාපන සුදුසුකම් :*

* අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත් විය යුතු ය. වාර දෙකක දී සාමාර්ථය ලබන අයදුම්කරුවෙකු ප්‍රථම වාරයේ දී විෂයයන් 05ක් සමත් විය යුතු ය.

*සටහන 01* : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03* : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම් :*

* *උස අඩි 05 යි. අඟල් 04 යි. (අවම),*
* පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

සටහන : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් .—* එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කරුවෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙක් සුදුසුකම් :*

* අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

* අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

1. මීටර් 1,000 - මිනිත්තු 03, තත්පර 44.

* යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්‍ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

* ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

  * *වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.*-කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.

  * *සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.*-කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය :*
* අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්‍ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්‍ෂණයෙන් සමත්වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්‍ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *පසුබිම් පරීක්ෂාව :*

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :*

* රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

* 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතියික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

* පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි :*

* මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි :*

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරී කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු වන අතර මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පොලිස් පුහුණු අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පොලිස් පුහුණු අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, සේවය ස්ථිර කිරීමෙන් පසු පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම ගැසට් පත්‍රයේ I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික,(තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතු ය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත්, අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ

සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.*

*එන්. කේ. ඉලංගකෝන්,*
*පොලිස්පති.*

**පොලිස් දෙපාර්තමේන්තුව**

**ආධුනික පොලිස් කොස්තාපල් තනතුර**

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය. :———.

(ආ) නම (මුලකුරු සමග) :———.

(ඇ) අයදුම් කරන තනතුර :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතු ය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.

04. අයදුම්කරු උපන් ස්ථානය :———.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.

පළාත :———.

05. (අ) වර්තමාන ලිපිනය :———.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඇ) ස්ථිර ලිපිනය :———.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :———.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
(ඊ) දුරකතන අංකය - නිවස :———. ජංගම :———.

06. (අ) ජාතිය :———.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :———.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.

* අයදුම්කරු :———.
* අයදුම්කරුගේ පියා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :———.

07. උපන් දිනය :———. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි).

වයස :— (ගැසට් නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට)

අවුරුදු :———. මාස :———. දින :———.

08. උස : අඩි :———. අඟල් :———. පපුව : අඟල් :———.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන්කර සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය) :———.

10. අතිරේක සුදුසුකම් :———. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතු ය).

11. විවාහක/අවිවාහක බව :———.

12. (අ) දැනට කරන රැකියාව :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :———.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද ? :———.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ———,
(ආ) ———.

15. (අ) ඔබ පොලිස් උප සේවයේ හෝ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේ ද ? :———.
(එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න) :———.

(ආ) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේ ද ? :———.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න :———.

16. ඔබ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සාමාජිකයෙක් ද ? (එසේ නම් පත්වීමේ දිනය, නිලය, නිල අංකය සඳහන් කරන්න). පත්වීමේ ලිපියේ පිටපතක් අමුණන්න :———.

17. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

18. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

19. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ?

(එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

20. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක් වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

08-644

---

### ශ්‍රී ලංකා නිත්‍ය /ස්වේච්ඡා ගුවන් හමුදාව

ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් බඳවා ගැනීම සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත දැක්වෙන වෘත්තීන්වල ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී.

1. අ. වෘත්තීන් හා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්—

*නිත්‍ය බඳවාගැනීම්* :

(1) ශාරීරික අභ්‍යාස පුහුණුකරු (පිරිමි/කාන්තා)
සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

මලල ක්‍රීඩා වලින් ජාතික මට්ටමින් ලබාගත් ජයග්‍රහණයන්, තෝරා ගැනීමේදී විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(2) හෙද සහායක (පිරිමි/කාන්තා)/දන්ත සහායක නිත්‍ය (පිරිමි)

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂය ධාරාවන්ගෙන් ප්‍රධාන විෂයයන් තුනක් එක් වරකදී සමත්ව තිබීම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් ලෙස සැලකේ.

*ඉඳුරාම බඳවාගැනීම් (ස්වේච්ඡා - පිරිමි/කාන්තා)* :

(3) ශල්‍ය වෛද්‍යාගාර කාර්මික

වෘත්තීය සුදුසුකම් (රජයේ හෙද විදුහල් මගින්)
වසර දෙකක (02) ශල්‍ය වෛද්‍යාගාර කාර්මික පාඨමාලාව හදාරා තිබීම.

පළපුරුද්ද -
මෙරට හෝ විදෙස් රටක පිළිගත් රෝහලක වසර දෙකක (02) පළපුරුද්ද

වෘත්තීය සුදුසුකම් (පෞද්ගලික හෙද විදුහල් මගින්)-

වසර දෙකක (02) සුදුසුකම්ලත් ශල්‍ය වෛද්‍යාගාර කාර්මික පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.

පළපුරුද්ද -

මෙරට හෝ විදෙස් රටක පිළිගත් රෝහලක ශල්‍ය වෛද්‍යාගාර කාර්මිකයකු ලෙස වසර දෙකක (02) පලපුරුද්ද.

(4) ශල්‍ය වෛද්‍යාගාර හෙද

වෘත්තීය සුදුසුකම් (රජයේ හෙද විදුහල් මගින්) -

රජයේ හෙද විදුහලක වසර තුනක (03) හෙද පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ සහතික ලත් හෙද/හෙදියක ලෙස ලියාපදිංචි වී තිබීමත් පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල කොළඹ, මගින් පවත්වනු ලබන ශල්‍ය වෛද්‍යාගාර හෙද පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ ශල්‍යාගාර සේවයේ අවම වසර තුනක (03) පළපුරුද්දක් තිබීම.

පළපුරුද්ද-

මෙරට හෝ විදෙස් රටක පිළිගත් රෝහලක වසර දෙකක (02) පළපුරුද්ද.

වෘත්තීය සුදුසුකම් (පෞද්ගලික හෙද විදුහල් මගින්)-

වසර (03) තුනක හෙද පුහුණු පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව ශල්‍ය වෛද්‍යාගාර හෙද පුහුණු පාඨමාලාවක් හැදෑරීමත් සමග වසර දෙකක (02) පළපුරුද්ද,

පළපුරුද්ද -

මෙරට හෝ විදෙස් රටක පිළිගත් රෝහලක ශල්‍ය වෛද්‍යාගාර හෙද/හෙදියක ලෙස වසර දෙකක (02) පළපුරුද්ද

(5) දැඩි සත්කාර ඒකක හෙද

වෘත්තීය සුදුසුකම් (රජයේ හෙද විදුහල් මගින්)-

වසර තුනක (03) හෙද පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ සහතික ලත් හෙද/හෙදියක

ලෙස ලියාපදිංචි වී තිබීමත් පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල කොළඹ. මගින් පවත්වනු ලබන දැඩි සත්කාර ඒකක හෙද පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.

පළපුරුද්ද-

මෙරට හෝ විදෙස් රටක පිළිගත් රෝහලක වසර දෙකකට (02) නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

වෘත්තීය සුදුසුකම් (පෞද්ගලික හෙද විදුහල් මගින්)-

වසර තුනක (03) හෙද පුහුණු පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව දැඩි සත්කාර ඒකක හෙදපුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස හැදෑරීමත් සමග වසර දෙකක (02) පළපුරුද්ද.

පළපුරුද්ද

මෙරට හෝ විදෙස් රටක පිළිගත් රෝහලක දැඩි සත්කාර ඒකක හෙද/හෙදියක ලෙස වසර දෙකකට (02) නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(ආ) *අනෙකුත් සුදුසුකම් :*

ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය /ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින් /අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතු ය.

(1) *පුරවැසිභාවය.*—ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

(2) *වයස :*

2014 අගෝස්තු මස 31 දිනට
නිත්‍ය අවුරුදු 18ත් 23ත් අතර (පිරිමි) අවුරුදු 18ත් 22ත් අතර (කාන්තා)
ස්වේච්ඡා අවුරුදු 18ත් 37ත් අතර (පිරිමි) අවුරුදු 18ත් 30ත් අතර (කාන්තා)

(3) *උස.*—

| | | |
|---|---|---|
| නිත්‍ය - | පිරිමි | අඩි 5 අඟල් 5ට නොඅඩු විය යුතුයි. |
| | කාන්තා | අඩි 5 අඟල් 3ට නොඅඩු විය යුතුයි. |
| ස්වේච්ඡා- | පිරිමි | අඩි 5 අඟල් 4ට නොඅඩු විය යුතුයි. |
| | කාන්තා | අඩි 5 අඟල් 2ට නොඅඩු විය යුතුයි. |

(4) *බර.*— 17 < ශරීර ස්කන්ධ දර්ශකය <26 (පිරිමි)
17 < ශරීර ස්කන්ධ දර්ශකය <25 (කාන්තා)

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} : \frac{\text{බර(කි.ග්‍රෑ)}}{\text{උස}^2\ \text{(මී)}}$$

(5) වර්ණ දෘෂ්ටිය.— සීපී 2

(6) දෘෂ්ටි තීක්ෂණත්වය.—
නිත්‍ය වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත)
ස්වේච්ඡා වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත හෝ සහිත)

(7) සිවිල් තත්ත්වය.—
නිත්‍ය අයදුම්කරුවන්/අයදුම්කාරියන් - අවිවාහක
ස්වේච්ඡා අයදුම්කරුවන්/අයදුම්කාරියන් - විවාහක හෝ අවිවාහක

(අ) නිත්‍ය අයදුම්කරුවන්/අයදුම්කාරියන් අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර දෙකක් ගතවන තුරු මෙන්ම මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහවීමට ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.)

(ආ) අවිවාහක ස්වේච්ඡා ගුවන් භටයින් හෝ ගුවන් කාන්තාවන් හට මූලික පුහුණු පාඨමාලාව අවසන් වන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

2. පළමුවන ඡේදයෙහි "අ" හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ පළමුවන ඡේදයේ "ආ" හි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර හා ඇස් පරීක්ෂා කරනු ලබන අතර *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිමිවලට අනුව උස, බර හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් සම්මුඛ පරීක්ෂණය සමත්වීම මත ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

3. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨතා ලබා ඇතොත් ඒ ගැන සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. *සේවා කොන්දේසි :*

(අ) ගුවන්භටයින්/ගුවන් කාන්තාවන් සේවයට බැඳුණුදා සිට ගුවන් හමුදා පනතට, ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

(ආ) තෝරාගනු ලබන සියලුම නිත්‍ය ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට මූලික සටන් පුහුණුවත් ඉන් පසුව වෘත්තීය පුහුණුවත් ලබා දෙන අතර, ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වයන්හි වුව ද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශ රටක දී ඉටුකළ යුතු ය.

(ඇ) තෝරාගනු ලබන සියලුම ස්වේච්ඡා ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට මූලික සටන් පුහුණුවෙන් පසු ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වයන්හි වුවද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළදී හෝ විදේශ රටකදී ඉටුකල යුතු ය.

5. *බඳවා ගැනීමේ කොන්දේසි.-*

නිත්‍ය - (පිරිමි/කාන්තා)

තෝරාගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තෙවන ශ්‍රේණියේ ගුවන්භට නිළයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර දොළහක (12) සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවකදී වාර්තා කළ යුතුයි. අවුරුදු 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන්භටයින්/ගුවන් කාන්තාවන් හට අවස්ථාව ලබාදෙනු ඇත.

ස්වේච්ඡා - (පිරිමි/කාන්තා)

තෝරාගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තෙවන ශ්‍රේණියේ නායක ගුවන්භට/නායක ගුවන් කාන්තා සහ කෝප්‍රල් යන නිළයන්ට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 5ක සේවා කාලයකට යටත් විය යුතුයි. අවුරුදු 05ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

6. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන්.*- තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියා කළ යුතුයි.

7. *වැටුප් හා දීමනා* :-

*(අ)* වසරකට ගුවන් හටයින්ට අදාළ ඒකාබද්ධ වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ. :-

ගුවන්භට - රු. 1,73,100 - 6 x 1,740 - 19 x 2040 = රු. 222,300.00
නායක ගුවන්භට - රු. 1,78,320 - 4 x 1,740 - 19 x 2040 = රු. 222,300.00

කෝප්‍රල් - රු. 183,540.00 - 10 x 2040.00 - 9 x 2880.00 = රු. 229,860.00

සැරයන් - රු. 187,620.00 - 3 x 2040.00 - 9 x 2880.00-3x3840.00 = රු. 231,180.00

බලපත්‍ර සැරයන් - රු. 191,700.00 - 1 x 2040.00 - 9 x 2880.00-3x3840.00 = රු. 231,180.00

බලලත් නිළධාරින් - රු. 1,99,500 - 7 x 2,880 - 14 x 3,840 = රු. 2,73,420
ප්‍රධාන බලලත් නිළධාරින් - රු. 2,23,500 - 13 x 3,840 = රු. 2,73,420

ඉහත දැක්වෙන පරිදි වාර්ෂික ඒකාබද්ද වැටුප් පරිමාණයන්ට අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. ගුවන්භටයින්ගේ/ගුවන් කාන්තාවන්ගේ සේවා කාලය යහපත් කල්ක්‍රියාව සහ කාර්යක්ෂමතාව මත ඉදිරි නිලයන් පිරිනමනු ලබන අතර ඒ අනුව නියමිත වැටුප් දර්ශකයන්හි පිහිටුවනු ලැබේ.

*(ආ)* දීමනා :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800 ක් ගෙවනු ලැබේ.

(2) දුෂ්කර දීමනා මසකට රු. 600 ක් ගෙවනු ලැබේ.

(3) ක්‍රියාත්මක සේවයේ සේවය කරන්නන්හට මසකට රු.4,500 ක් ගෙවනු ලැබේ.

(4) *විශේෂ දීමනාව* මසකට රු. 2,400 ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 80 බැගින්)

(5) *විශේෂ දීමනාව* වැටුපෙන් 15% සහ රු. 375.00

(6) *දිරි දීමනා.*- සේවා කාලය වසර 5 සම්පූර්ණ කිරීමෙන් පසුව මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට රු. 250 සිට රු. 850 දක්වා).

(7) *ආහාර දීමනා.*- පිටත වාසය කරන ගුවන් හටයින්ට මසකට රු.13,197.00 බැගින් ගෙවනු ලැබේ. (කඳවුරු තුළ වාසය කරන ගුවන්හටයින්ට/ගුවන් කාන්තාවන්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.)

(8) නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව : මසකට රු. 170.00ක් ගෙවනු ලැබේ.

(9) අන්තර් දීමනාව : මසකට රු. 1,000.00ක් ගෙවනු ලැබේ.

(10) *නේවාසික පහසුකම්.*-කඳවුර තුළ වාසය කරන ගුවන් හටයින්ට /ගුවන් කාන්තාවන්ට නේවාසික පහසුකම් සපයනු ලැබේ.

(11) *ගමනාගමනය.*- වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන් හටයා/ භාර්යාව සහ ළමයින්ට අදාළ පරිදි) දෙනු ලැබේ. ඊට අමතරව කඳවුර තුළ සිටින ගුවන් හටයින්ට/ගුවන් කාන්තාවන්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.

(12) *වික්ෂේපණ දීමනා.*- මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැබේ. (ගෙවීම් ප්‍රමාණය විවාහක/අවිවාහක බව අනුව වෙනස් වේ.)

(13) *සුදුසුකම් වැටුප්.*-ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් වූ විශේෂ පාඨමාලාවක් හදාරා ඇති හෝ විශේෂ සුදුසුකම් ඇති අයට මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට උපරිම රු. 637.50)

(14) *යහපත් කල්ක්‍රියා ලාංඡන දීමනා.*- මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යනු ලබන තැනැත්තන්ටය. (මසකට රු. 30 සිට රු. 511.00 දක්වා)

(15) *නැවත සේවයට බැඳීමේ වැටුප්.*- නැවත සේවයට බැඳෙන ගුවන් හටයන්ට මසකට රු.300 බැගින් දීමනාවකට හිමිකම් ලැබේ.

(16) *වෛද්‍ය පහසුකම්.*- ගුවන් හමුදාව මගින් සෑම ගුවන් හටයකුටම/ගුවන් කාන්තාවකටම නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර විවාහක නම් ඔහුගේ/ඇයගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(17) කඳවුරුවල සිට සැතපුම් 30 ක (කි. මී. 48 ක) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් හටයන්/ගුවන් කාන්තාවන් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මගින් නොමිලේ ගමන් කිරීම සඳහා නිදහස් ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(18) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක ගුවන්හටයින්ට /ගුවන් කාන්තාවකටම මසකට රු. 1,200 සිට රු. 3,300 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමිවේ.

(19) *උපදේශක දීමනාව.*- මසකට රු. 425 සිට රු. 510 දක්වා දීමනාවක් හිමිවේ.

(20) *වෙනත් දීමනා.*- (වෙන්ව සිටීමේ හා විදේශ ගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.

(21) වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන්හටයින් /ගුවන් කාන්තාවන් දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

9. *ඉල්ලුම්කරුට /ඉල්ලුම්කාරියට උපදෙස්* :

*(අ)* පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුයි.

*(ආ)* රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන් හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු /සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තවද යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක්ද ඒ සමඟ තිබිය යුතුයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙනවිට හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂකයා විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.)

(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික.

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(4) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතු ය.

(5) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරනු ලැබූවිට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ඉ) කිසිදු ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් ඉල්ලුම්පත් සමග නොඑවිය යුතුයි.

(ඊ) ඉල්ලුම්පත් සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

09. සම්මුඛ පරීක්‍ෂණයන්ට සුදුසු යැයි සලකනු ලබන අපේක්‍ෂකයින්/අපේක්ෂිකාවන් ඔවුන්ගේ ම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්‍ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්‍ෂණ පිරිමි අයදුම්කරුවන්ට 2014 අගෝස්තු මස 11, 12 සහ 13 යන දිනවල පෙ. ව. 0900 පැයේ සිට ප. ව. 1300 පැය දක්වා ද කාන්තා අයදුම්කාරියන්ට 2014 අගෝස්තු මස 14 සහ 15 යන දිනවල පෙ. ව. 0900 පැයේ සිට ප. ව. 1300 පැය දක්වා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෘත්තීය පුහුණු පාසැල ඒකල කඳවුරේදී පැවැත්වේ.

10. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්/අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

11. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් ලැයිස්තුගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහළ මට්ටමේ සිටයි.

12. අයදුම්කරුවෙක්/අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක්/අපේක්ෂිකාවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගුවීමට හේතු වන්නේ ය.

13. ඉල්ලුම්පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/අපේක්ෂිකාව තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වේ.

14. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

කේ. ඒ. ගුණතිලක,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා අයදුම්පත

1. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :————.
3. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය :————.
4. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) :————.
5. ස්ථිර ලිපිනය :————.
6. ආසන්නතම ගුවන් හමුදා කඳවුර :————.
7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
8. දිස්ත්‍රික්කය :————.
9. මැතිවරණ කොට්ඨාසය :————.
10. ග්‍රාම නිළධාරි කොට්ඨාසය :————.
11. දුරකථන අංකය :————.
12. උපන් දිනය :————.
13. වයස (2014 අගෝස්තු මස 31 වන දිනට) අවුරුදු :————. මාස :————. දින :————.
14. විවාහක/අවිවාහක බව :————.
15. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
16. උස : අඩි :————, අඟල් :————.
17. අ.පො.ස. (සා.පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

18. අ.පො.ස. (උ.පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

19. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (උදාහරණ වශයෙන් කාර්මික හෝ වෙනත් වෘත්තීය පුහුණුව සහ පළපුරුද්ද ආදිය) :————.

20. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ටතා පිළිබඳ විස්තර :————.

21. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී ලබා ඇති වෙනත් විශිෂ්ටතා :————.

22. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

23. සිවිල් හෝ යුද්ධ අධිකරණයේ දී වැරදිකරු වී ඇති හෝ ඇඟ බැඳ හෝ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

24. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවි නාමය | ලිපිනය |
|---|---|---|
| | | |

25. ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :-

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

08-578

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 සැප්තැම්බර් මස 15 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ජූලි මස 18 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගම්පහ | අත්තනගල්ල | වතුපිටිවල මූලික රෝහල් කොට්ඨාසයේ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |
| ගම්පහ | දිවුලපිටිය | ගොඩකහ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා උතුරු අළුත්කුරු කෝරළේ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |

08-563

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතලේ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 සැප්තැම්බර් මස 09 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ජූලි මස 25 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතලේ | දඹුල්ල | මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල නගරය කොට්ඨාසයේ උප්පැන්න මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. |

08-566

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**අ.පො.ස. (උසස් පෙළ) නව තාක්ෂණ විෂය ධාරාවේ ජෛව පද්ධති තාක්ෂණවේදය හා තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 ශ්‍රේණියට බඳවා ගැනීම**

අ.පො.ස. (උසස් පෙළ) නව තාකෂණවේදය විෂය ධාරාව යටතේ දැයේ දරුවන්ගේ නැණස පැදීම උදෙසා ආරම්භ කළ මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර සහිත ද්විතියික පාසල්වල ජෛව පද්ධති තාක්ෂණවේදය හා තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 ශ්‍රේණියට ගුරුවරුන් බඳවා ගැනීම පිණිස සුදුසුකම්ලත් උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1 **යෝග්‍යතා**

1.1 *සාමාන්‍ය සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය,
(ii) යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යනේ යුක්ත විය යුතු ය,
(iii) 2014.09.15 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35 නොවැඩි විය යුතු ය.

1.2 *අධ්‍යාපන සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2014.09.15 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඉල්ලුම් කරනු ලබන නියමිත විෂයයට අදාළ උපාධියක් ලබා තිබිය යුතු ය.

ඒ අනුව ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය සඳහා ඉල්ලුම් කරන උපාධිධාරීන් කෘෂි විද්‍යා උපාධියක් ලබා තිබිය යුතු අතර,

තාක්ෂණය සඳහා විද්‍යාව විෂයය සඳහා ඉල්ලුම් කරන උපාධිධාරීන් තම උපාධියට භෞතික විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හාදාරා තිබිය යුතු ය.

(ii) අධ්‍යාපන අමාත්‍යාංශය පිළිගත් ප්‍රතිපත්තිය මත අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාගය පහත සඳහන් පරිදි සමත්ව තිබිය යුතු ය.

* අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන 3 ක් සහිතව මව්බස හා ගණිතය ද ඇතුළත්ව විෂයයන් 06 කින් සමත්වීම,
* අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයන් 3 කින් සමත්වීම.

**සටහන.**—විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාග හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ට ද ඉල්ලුම් කළ හැකි ය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය සහ සේවා කොන්දේසි* :

2.1 මෙම දැන්වීමට අදාළව පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් ව සිටී නම් ඔවුන් සේවයට බඳවා ගැනීමේ පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන අයුරින් තරග විභාගයක් පවත්වනු ලබන අතර, එමගින් ලබා ගන්නා මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාව හා පාසල් පාදක ක්‍රමය පදනම් කර ගෙන, පවතින ගුරු පුරප්පාඩු සඳහා පත්වීම් ලබා දීමට සුදුස්සන් තෝරා ගනු ලැබේ. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

2.2 එමෙන් ම පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අයැදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති විටක නම් බඳවා ගැනීමේ තරග විභාගයක් පවත්වනු නොලැබේ. මෙහි දී අයැදුම්කරුවන් ගුරු සේවයට බඳවා ගැනීමේ සුදුසුකම් පරීක්ෂණයකට පමණක් මුහුණ දිය යුතු වේ.

2.3 ඉල්ලුම්කරුවන් ඇමුණුම 1 හි සඳහන් ගුරු පුරප්පාඩු පවතින පාසල් සඳහා පමණක් බඳවාගනු ලබන අතර, එම පාසල්වල සේවය කිරීමට කැමති අය පමණක් මේ සඳහා ඉල්ලුම් කළ යුතු වේ.

*සටහන* :

ඉල්ලුම් කරනු ලබන පාසලේ පවතින විෂයයට අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි ඉල්ලුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක දී තරග විභාගයේ දී ලබා ගන්නා ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත. එකම පාසලට ඉල්ලා ඇති ඉල්ලුම් කරුවන් කිහිප දෙනෙකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවක පාසලට දුර ප්‍රමාණය අනුව ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. එම නිර්ණායක මත සුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කරනු ඇත.

*ඇමුණුම 1*

**සිංහල මාධ්‍යය ගුරු පුරප්පාඩු ලේඛනය**

**ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය :**

| *පළාත* | *අනුක්‍රමික අංකය* | *පාසලේ නම* | *ලිපිනය* | *ගුරු පුරප්පාඩු* |
|---|---|---|---|---|
| නැගෙනහිර | 1 | පොල්වත්ත මහා විද්‍යාලය | පොල්වග ජනපදය, අම්පාර | 1 |
| උතුරු මැද | 2 | කැබිතිගොල්ලෑව මහා විද්‍යාලය | කැබිතිගොල්ලෑව | 1 |
| | 3 | විද්‍යාදර්ශ මහා විද්‍යාලය | නොච්චියාගම | 1 |
| | 4 | මැදිරිගිරිය ජාතික පාසල | මැදිරිගිරිය | 1 |
| | 5 | ලීලාරත්න මහා විද්‍යාලය | හන්සයාපාලම | 1 |
| | 6 | වැලිකන්ද මහා විද්‍යාලය | වැලිකන්ද | 1 |
| | 7 | ශ්‍රී සිද්ධාර්ථ විද්‍යාලය | එප්පාවල | 1 |
| සබරගමුව | 8 | විජේරිය සුමන මහා විද්‍යාලය | විජේරිය (රක්වාන හරහා) | 1 |
| | 9 | පින්නවල මධ්‍ය මහා විද්‍යාලය | රඹුක්කන | 1 |
| උතුරු | 10 | මඩුකන්ද මධ්‍ය මහා විද්‍යාලය | මඩුකන්ද වව්නියාව | 1 |
| බස්නාහිර | 11 | මහින්ද රාජපක්ෂ විද්‍යාලය | පිටිපන හෝමාගම | 1 |
| දකුණ | 12 | බටපොල ම.ම.වි. | බටපොල | 1 |
| | 13 | කරන්දෙනිය ම.ම.වි. | කරන්දෙනිය | 1 |
| ඌව | 14 | ජනාධිපති විද්‍යාලය | අඹගස්දෝව වැලිමඩ | 1 |
| | 15 | මීගහකිවුල මධ්‍ය මහා විද්‍යාලය | මීගහකිවුල | 1 |
| වයඹ | 16 | ශ්‍රී පරාක්‍රම ජාතික පාසල | කොබෙයිගනේ | 1 |
| මධ්‍යම | 17 | නාමිණිඔය ම.ම.වි. | වැලිගම, මාතලේ | 1 |
| | 18 | රන්ගිරි දඹුලු ජාතික පාසල | දඹුල්ල | 1 |
| | 19 | නුගවෙල ම.ම.වි. | නුගවෙල | 1 |

තාක්ෂණය සඳහා විද්‍යාව විෂයය :

| පළාත | අනුක්‍රමික අංකය | පාසලේ නම | ලිපිනය | ගුරු පුරප්පාඩු |
|---|---|---|---|---|
| උතුරුමැද | 1 | මෛත්‍රීපාල සේනානායක විද්‍යාලය | මැදවච්චිය | 1 |
| | 2 | මැදිරිගිරිය ජාතික පාසල | මැදිරිගිරිය | 1 |
| | 3 | තඹුත්තේගම මධ්‍ය මහා විද්‍යාලය | තඹුත්තේගම | 1 |
| | 4 | පලුගස්දමන මහ විද්‍යාලය | පලුගස්දමන, පොලොන්නරුව | 1 |
| | 5 | විලයාය මධ්‍ය මහ විද්‍යාලය | අරලගන්විල | 1 |
| | 6 | මහසෙන් මහ විද්‍යාලය | බකමූණ | 1 |
| | 7 | වැලිකන්ද මහ විද්‍යාලය | වැලිකන්ද | 1 |
| | 8 | ලීලාරත්න විජේසිංහ මහ විද්‍යාලය | හංසයාපාලම | 1 |
| වයඹ පළාත | 9 | මහසෙන් ජාතික පාසල | නිකවැරටිය | 1 |
| උතුරු පළාත | 10 | මඩුකන්ද ජාතික පාසල | මඩුකන්ද, වව්නියාව | 1 |
| නැගෙනහිර පළාත | 11 | පොල්වත්ත මහ විද්‍යාලය | පොල්වත්ත ජනපදය අම්පාර | 1 |
| | 12 | අභයපුර මහ විද්‍යාලය | අභයපුර, ත්‍රිකුණාමලය | 1 |

දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු ලේඛනය

ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය :

| පළාත | අනුක්‍රමික අංකය | පාසලේ නම | ලිපිනය | ගුරු පුරප්පාඩු |
|---|---|---|---|---|
| උතුර | 1 | කිලි/කිලිනොච්චි ම.ම.වි. | A9 පාර, බටහිර ආනන්දපුරම් | |
| | | | කිලිනොච්චිය | 1 |
| | 2 | කිලිනොච්චි හින්දු විද්‍යාලය | ජාන්තිනගර්, කිලිනොච්චිය | 1 |
| | 3 | තාම්පුරම් ම. වි. | තාම්පුරම්, පරන්තන් | 1 |
| | 4 | එරුක්කම්පිඩ්ඩි මුස්ලිම් ම.ම.වි. | එරුක්කම්පිඩ්ඩි, මන්නාරම | 1 |
| | 5 | මන්/මුරුන්කන් ම.වි. | මුරුක්කන්, මන්නාරම | 1 |
| | 6 | මු/විද්‍යානන්ද විද්‍යාලය | මුල්ලියාවේලෙයි | 1 |
| | 7 | ඔඩ්ඩුසුඩාන් ම. වි. | විද්‍යාපුරම්, ඔඩ්ඩුසුඩාන් | 1 |
| | 8 | ව/වෙඩ්ඩිකුලම ම. වි. | වෙඩ්ඩිකුලම් | 1 |
| | 9 | වව්නියා දෙමළ ම.ම.වි. | වව්නියාව | 1 |
| | 10 | මනිපායි හින්දු විද්‍යාලය | මනිපායි | 1 |
| | 11 | වයවිලාන් ම.ම.වි. | වයවිලාන් | 1 |
| | 12 | නාල්ලිඅඩි ම.ම.වි. | කරවෙඩ්ඩි | 1 |
| | 13 | යාපනය හින්දු විද්‍යාලය | යාපනය | 1 |
| නැගෙනහිර | 14 | මඩ/ඔඩ්ඩමාවඩි ම.ම.වි. (ජා.පා.) | ඔඩ්ඩමාවඩි | 1 |
| | 15 | මඩ/වාලච්චේනෙයි අන්නූර් ම. වි. | වාලච්චේනෙයි | 1 |
| | 16 | මඩ/කිරාන් ම.වි. | කිරාන් | 1 |
| | 17 | මඩ/වන්දාරමූලෙයි ම.ම.වි. | සිත්තන්ඩි -1 | 1 |
| | 18 | මඩ/හින්දු විද්‍යාලය | මඩකලපුව | 1 |
| | | | 322, වෙරළ පාර, නව | |
| | 19 | මඩ/කාත්තන්කුඩි ම.ම.වි. | කාත්තන්කුඩි - 06 | 1 |
| | 20 | කල්/සමන්තුරෙයි ම.ම.වි. (ජා.පා.) | සමන්තුරෙයි | 1 |
| | 21 | සහිරා විද්‍යාලය (ජා.පා) | සහිරා විද්‍යාල පාර, ආයින්තමරුතු | 1 |
| | 22 | අක්කරෙයිපත්තු මුස්ලිම් ම.ම. වි. | අක්කරෙයිපත්තු | 1 |
| | 23 | ශ්‍රී රාමක්‍රිෂ්ණ විද්‍යාලය | අක්කරෙයිපත්තු | 1 |
| | 24 | විපුලානන්ද විද්‍යාලය | නුවර පාර, ත්‍රිකුණාමලය | 1 |

| පළාත | අනුක්‍රමික අංකය | පාසලේ නම | ලිපිනය | ගුරු පුරප්පාඩු |
|---|---|---|---|---|
| | 25 | අඩ්ඩාලච්චේනෙයි ම.ම.වි. | අඩ්ඩාලචේනෙයි | 1 |
| | 26 | ත්‍රි/මු/මුතූර් ම.ම.වි. | නොක්ස් පාර, මුතූර් | 1 |
| දකුණ | 27 | මල්හුරුස්සුල්හියා ජාතික පාසල | එච්. කේ. එඩ්මන්ඩ් මාවත, ගාල්ල | 1 |
| | 28 | සහිරා ජාතික පාසල | හම්බන්තොට | 1 |
| සබරගමුව | 29 | අල්-අසාර් මුස්ලිම් ම.වි. | හෙම්මාතගම | 1 |
| ඌව | 30 | හපුතලේ දෙමළ ම.වි. | හපුතලේ | 1 |
| | 31 | සරස්වතී ම.ම.වි. | මහියංගන පාර, බදුල්ල | 1 |
| | 32 | පස්සර දෙමළ ම. වි. | පස්සර | 1 |
| වයඹ | 33 | හිස්බුල්ල ම.ම.වි. | කුරුණෑගල | 1 |
| | 34 | සහිරා ජාතික පාසල | පුත්තලම | 1 |
| | 35 | කැකුණගොල්ල මුස්ලිම් ම.ම.වි. | ගිරිඋල්ල | 1 |
| මධ්‍යම | 36 | මදීනා මුස්ලිම් විද්‍යාලය | මඩවල බසාර් | 1 |
| | 37 | කදිරේෂන් ම.ම.වි. | කොත්මලේ පාර, නාවලපිටිය | 1 |
| | 38 | හින්දු ජාතික පාසල | නුවරඑළිය පාර, පුස්සැල්ලාව | 1 |
| | 39 | අල්-මනාර් ම.ම.වි. | හන්දෙස්ස | 1 |
| | 40 | අජ්මීර් ජාතික පාසල | ඇල්කඩුව පාර, උකුවෙල | 1 |
| | 41 | හොල්බෲක් දෙමළ ම.වි. | ආගරපතන | 1 |
| | 42 | නොර්වුඩ් දෙමළ ම.වි. | නොර්වුඩ් | 1 |
| | 43 | රාගල දෙමළ මහා විද්‍යාලය | හල්ග්‍රාන්ඔය | 1 |
| | 44 | කේම්බ්‍රිජ් විද්‍යාලය | කොටගල | 1 |

**තාක්‍ෂණය සඳහා විද්‍යා විෂයය :**

| පළාත | අනුක්‍රමික අංකය | පාසලේ නම | ලිපිනය | ගුරු පුරප්පාඩු |
|---|---|---|---|---|
| බස්නාහිර | 1 | අල්මුබාරක් ම.ම.වි | මල්වාන | 1 |
| මධ්‍යම | 2 | හින්දු ජාතික පාසල | නුවරඑළිය පාර, පුස්සැල්ලාව | 1 |
| | 3 | අල්-මනාර් ම.ම.වි. | හන්දෙස්ස | 1 |
| | 4 | අජ්මීර් ජාතික පාසල | උකුවෙල | 1 |
| | 5 | කදිරේෂන් ම.ම.වි. | කොත්මලේ පාර, නාවලපිටිය | 1 |
| | 6 | හොල්බෲක් දෙමළ ම.වි. | ආගරපතන | 1 |
| | 7 | නොර්වුඩ් දෙමළ ම. වි. | නොර්වුඩ් | 1 |
| | 8 | රාගල දෙමළ මහා විද්‍යාලය | හාල්ග්‍රාන්ඔය | 1 |
| | 9 | කේම්බ්‍රිජ් විද්‍යාලය | කොටගල | 1 |
| දකුණ | 10 | අර්ෆා ජාතික පාසල | වැලිගම | 1 |
| | 11 | සහිරා ජාතික පාසල | හම්බන්තොට | 1 |
| වයඹ | 12 | කැකුණගොල්ල මුස්ලිම් ම.ම.වි. | ගිරිඋල්ල | 1 |
| | 13 | සහිරා ජාතික පාසල | පුත්තලම | 1 |
| | 14 | හිස්බුල්ලා මුස්ලිම් ම.ම.වි. | තෙලියගොන්න | 1 |
| ඌව | 15 | සරස්වතී ම.ම.වි. | මහියංගන පාර, බදුල්ල | 1 |
| | 16 | පස්සර දෙමළ ම.වි. | පස්සර | 1 |
| | 17 | හපුතලේ දෙමළ ම. වි. | හපුතලේ | 1 |
| සබරගමුව | 18 | අල්- අසාර් මුස්ලිම් ම. වි. | හෙම්මාතගම | 1 |
| උතුරු | 19 | මනිපායි හින්දු විද්‍යාලය | මනිපායි | 1 |
| | 20 | නෙල්ලිඅඩි ම. ම. වි. | කරවෙඩ්ඩි | 1 |
| | 21 | චාවකච්චේරි හින්දු විද්‍යාලය | චාවකච්චේරි | 1 |
| | 22 | යාපනය හින්දු විද්‍යාලය | යාපනය | 1 |

| පළාත | අනුක්‍රමික අංකය | පාසලේ නම | ලිපිනය | ගුරු පුරප්පාඩු |
|---|---|---|---|---|
| | 23 | වෙම්බඩි උසස් බාලිකා විද්‍යාලය | යාපනය | 1 |
| | 24 | වෙලානි ම.ම.වි. | වෙලානි | 1 |
| | 25 | වඩ්ඩු හින්දු විද්‍යාලය | සිතන්කර්නි | 1 |
| | 26 | වයවිලාන් ම.ම.වි. | වයවිලාන් | 1 |
| | 27 | ශ්‍රී සෝමාස් කන්ද විද්‍යාලය | පුතූර් | 1 |
| | 28 | මෙතෝදිස් උසස් බාලිකා විද්‍යාලය | පේද්‍රුරු තුඩුව | 1 |
| | 29 | කිලි/කිලිනොච්චි ම.ම.වි. | A9 පාර, බටහිර ආනන්දපුරම්, | |
| | | | කිලිනොච්චිය | 1 |
| | 30 | කිලිනොච්චි හින්දු විද්‍යාලය | ජාන්තිනගර්, කිලිනොච්චිය | 1 |
| | 31 | එරුක්කම්පිඩ්ඩි මුස්ලිම් ම.ම.වි. | එරුක්කම්පිඩ්ඩි, මන්නාරම | 1 |
| | 32 | මන්/මුරුන්කන් ම. වි. | මුරුන්කන්, මන්නාරම | 1 |
| | 33 | මු/විද්‍යානන්ද විද්‍යාලය | මුල්ලියාවේලෙයි | 1 |
| | 34 | මඩ්ඩුසුඩාන් ම. වි. | විද්‍යාපුරම් ඔඩ්ඩුසුඩාන් | 1 |
| | 35 | ව/වෙඩ්ඩිකුලම ම. වි. | වෙඩ්ඩිකුලම | 1 |
| | 36 | වව්නියා දෙමළ ම. ම. වි. | වව්නියාව | 1 |
| නැගෙනහිර | 37 | මඩ/ඔඩ්ඩමාවඩි ම. ම. වි. (ජා.පා.) | ඔඩ්ඩමාවඩි | 1 |
| | 38 | මඩ/වාලච්චේනෙයි අන්නූර් ම.වි. | වාලච්චේනෙයි | 1 |
| | 39 | මඩ/කාත්තන්කුඩි ම.ම.වි. | 322, වෙරළ පාර, නව කාත්තන්කුඩ්ඩි - 06 | 1 |
| | 40 | සමන්තුරේ ම.ම. වි. | සමන්තුරෙයි | |
| | 41 | සහිරා විද්‍යාලය (ජා.පා) | සහිරා විද්‍යාල පාර, ආයින්තමරුතු | 1 |
| | 42 | අක්කරෙයිපත්තු මුස්ලිම් ම.ම.වි. | අක්කරෙයිපත්තු | 1 |
| | 43 | අඩ්ඩාලච්චේනෙයි ම.ම.වි. | මහ වීදිය, අඩ්ඩාලචේනෙයි | 1 |
| | 44 | මුතූර් ම. ම. වි. | මුතූර් | 1 |
| | 45 | ශ්‍රී රාමක්‍රිෂ්ණ විද්‍යාලය | අක්කරෙයිපත්තු | 1 |
| | 46 | මඩ/කිරාන් ම.වි. | කිරාන් | 1 |
| | 47 | මඩ/වන්දාරමූලෙයි ම.ම.වි. | සිත්තන්ඩි -1 | 1 |
| | 48 | මඩ/හින්දු විද්‍යාලය | මඩකලපුව | 1 |
| | 49 | කලුතාවලෙයි මහා විද්‍යාලය | කලුතාවලෙයි | 1 |
| | 50 | විපුලානන්ද විද්‍යාලය | නුවර පාර, ත්‍රිකුණාමලය | 1 |

2.4 රජයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හා මින් මතුවට කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂයකයන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය (2007-08-24) දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (iv) අනුව මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය අංක T S -1-2006A දරන වැටුප් ඛණ්ඩය (මාසික රු. 14,135,180 x 9 - 240 x 6 - 330 x 5 - 400 x 7- 645 x 13 - රු. 30,030 ක්) වේ. ඔබ මෙම වැටුප් පරිමාණයේ 8 වන පියවර වන රු. 15,395 ක මාසික වැටුප මත පිහිටුවනු ලැබේ.

2.5 මෙම පත්වීම් ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

2.6 උසස් වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදු කරනු ඇත.

2.7 මෙම පත්වීම් ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථාන මාරු කිරීමේ පටිපාටියේ සඳහන් විධිවිධානවලට යටත්ය. පත්වීම් ලබාදීම පාසල් පාදකව සිදුකරනු ලබන හෙයින් වසර 05 ක් යන තෙක් ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර පත්වීම්ලාභීන් ඒ පිළිබඳව ගිවිසුමකටද යටත්විය යුතුය.

03. *අයදුම්කිරීමේ ක්‍රමය* :

3.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයේ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් සකස් කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතුය. (ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර ද අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) සම්පූර්ණ කරනු ලබන අයදුම් පත්‍රය මෙම නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

3.2 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

3.3 නිවැරිදිව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය 2014.09.15 වැනි දිනට හෝ ඊට පෙර, "ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "තාක්ෂණවේදය විෂයයන් ඉගැන්වීම සඳහා සිංහල හා දෙමළ මාධ්‍යය උපාධිධාරීන් ගුරුවරුන් ලෙස බඳවා ගැනීම - 2014" ලෙස අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතුය.

3.4 සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

3.5 එක් ඉල්ලුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පත්‍රයක් පමණි.

4. දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන් අයදුම්පත්‍රයේ අංක 7.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

5. සම්මුඛ පරීක්ෂණය සඳහා නියමිත දිනයේ දී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව පසුව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

6. එමෙන්ම සම්මුඛ පරීක්ෂණය දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

7. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

අනුර දිසානායක,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2014 අගෝස්තු මස 15 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

*අධ්‍යාපන අමාත්‍යාංශය*

*ආදර්ශ අයදුම්පත්‍රය*

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

*අ.පො.ස. (උසස් පෙළ) නව තාක්ෂණ විෂය ධාරාවේ ජෛව පද්ධති තාක්ෂණවේදය හා තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 ශ්‍රේණියට බඳවා ගැනීම*

| | | | |
|---|---|---|---|
| ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය (කෘෂි විද්‍යා උපාධිධාරීන්) | | සිංහල මාධ්‍යය | |
| | | දෙමළ මාධ්‍යය | |
| තාක්ෂණය සඳහා විද්‍යාව විෂයය (භෞතික විද්‍යා උපාධිධාරීන්) | | සිංහල මාධ්‍යය | |
| | | දෙමළ මාධ්‍යය | |

(තමා ඉල්ලුම් කරනු ලබන විෂයය හා මාධ්‍යය සඳහා ✓ ලකුණ යොදන්න)

| *අනුක්‍රමික අංකය* | *පළාත* | *පාසලේ නම* |
|---|---|---|
| | | |

(ඇමුණුම 1 හි සඳහන් අයුරින් ඉල්ලුම් කරනු ලබන පාසල හා අනුක්‍රමික අංකය මෙහි ලියන්න)

01.

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා : PERERA A. B) :————.

1.2 මුලකුරුවලින් දැක්වෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

02. වර්තමාන ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(කැඳවීම් ලිපි මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

03.

3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී - 1 පුරුෂ - 0) (අදාළ අංකය කොටුව තුළ ලියන්න) [ ]

3.2 විවාහක/අවිවාහක බව : අවිවාහක 1- විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය : වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

3.4 2014.09.15 වැනි දිනට වයස : අවු : [ | ] මාස : [ | ] දින : [ | ]

3.5 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

04. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :

| *අ.පො.ස. (සා.පෙළ) විභාගය* | *අ.පො.ස. (උ.පෙළ) විභාගය* |
|---|---|
| *වර්ෂය :*<br>*විභාග අංකය :* | *වර්ෂය :*<br>*විභාග අංකය :* |
| ..............................................<br>..............................................<br>..............................................<br>..............................................<br>..............................................<br>..............................................<br>..............................................<br>..............................................<br>..............................................<br>.............................................. | ..............................................<br>..............................................<br>..............................................<br>.............................................. |

05. *උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :*

4.1 උපාධිය :————.
4.2 නිකුත් කළ විශ්වවිද්‍යාලය :————.
4.3 උපාධිය වලංගු දිනය :————.
4.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් :————.
4.5 උපාධිය ලබා ඇති මාධ්‍යය :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මම දනිමි. තවද තරඟ විභාගයක් පැවත්වීම සම්බන්ධයෙන් පත්වීම් බලධරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

06. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන........................මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

————,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

07. අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

...................... මහතා/මහත්මිය/මෙනෙවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

08-665/1

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

අ.පො.ස. (උසස් පෙළ) නව තාක්ෂණ විෂය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය සඳහා පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා තාක්ෂණික ඩිප්ලෝමාධාරීන් ගුරුවරුන් ලෙස බඳවා ගැනීම

අ.පො.ස. (උසස් පෙළ) නව තාකෂණවේදය විෂය ධාරාව යටතේ දැයේ දරුවන්ගේ නැණස පෑදීම උදෙසා ආරම්භ කළ මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර සහිත ද්විතියික පාසල්වල ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය ඉගැන්වීම සඳහා පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 ශ්‍රේණියට ගුරුවරුන් බඳවා ගැනීම පිණිස සුදුසුකම්ලත් යාන්ත්‍රික තාක්‍ෂණය, ඉදිකිරීම් තාක්‍ෂණය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමාධාරීන්ගෙන් හා ප්‍රථිඵල අපේක්‍ෂිත ඩිප්ලෝමාධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1 **යෝග්‍යතා :**

1.1 **සාමාන්‍ය සුදුසුකම් :-**

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය,
(ii) යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය,
(iii) 2014.09.15 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35 නොවැඩි විය යුතුය.

1.2 *අධ්‍යාපන සුදුසුකම් :-*

(*අ*)

(i) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණික අධ්‍යාපන ආයතනය (SLIATE) විසින් පිරිනමනු ලබන ඉංජිනේරු තාක්‍ෂණය පිළිබඳ සිව් අවුරුදු උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE),
(ii) මොරටුව විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තුන් අවුරුදු ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (NDT),
(iii) කටුනායක ඉංජිනේරු තාක්‍ෂණ ආයතනය මගින් පිරිනමනු ලබන සිව් අවුරුදු ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES),
(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (DT),
(v) ශ්‍රී ලංකා තෘතීය සහ වෘත්තීය පුහුණු කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතන මගින් පිරිනමනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට අදාළ උසස් ඩිප්ලෝමාව (NVQ Level 6),
(vi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ වෘත්තීය සුදුසුකම් සම කිරීම් සහ බලාත්මක කිරීමේ කොමිසම විසින් ඉහත ඩිප්ලෝමාවන්ට සමාන යැයි අනුමත කර ඇති වෙනත් දේශීය හෝ විදේශීය ඩිප්ලෝමා (මෙම සහතික සම්මුඛ පරීක්‍ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.),

සටහන.-ඉහත I සිට IV දක්වා සඳහන් වන ඩිප්ලෝමාධාරීන්,

* යාන්ත්‍රික තාක්‍ෂණවේදය
* ඉදිකිරීම් තාක්‍ෂණවේදය
* විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණවේදය යන ක්ෂේත්‍රයන්ගෙන් එකකට අයත් විය යුතු අතර වෙනත් ක්ෂේත්‍රවල තාක්‍ෂණික ඩිප්ලෝමාධාරීන් සලකා බලනු නොලැබේ.

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන 3 ක් සහිතව මව්බස හා ගණිතය ද ඇතුළත්ව විෂයයන් 06 කින් සමත්වීම,

(ඇ) අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයන් 3 කින් සමත්වීම.

***සටහන-*** විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාග හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ට ද ඉල්ලුම් කළ හැකිය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය සහ සේවා කොන්දේසි :*

2.1 මෙම දැන්වීමට අදාළව ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් වෙනුවෙන් සේවයට බඳවා ගැනීමේ පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක් පවත්වා එයින් ලබාගන්නා ලකුණුවල ප්‍රමුඛතාව පදනම් කර ගෙන, පවතින ගුරු පුරප්පාඩු සඳහා පත්වීම් ලබාදීමට සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2 රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට ද, යටත්ව තෝරා ගනු ලබන අපේක්‍ෂකයෙක් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය (2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (iv) අනුව) රු. 14,135-180x9-240x6-330x5-400x7-645x13 -රු. 30,030 ක් ඔබ මෙම වැටුප් පරිමාණයේ 1 වන පියවර වන රු. 14,135 ක මාසික වැටුප මත පිහිටුවනු ලැබේ.

2.3 මෙම පත්වීම් ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

2.4 උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විවිධාන යටතේ සිදු කරනු ඇත.

2.5 ඉල්ලුම්කරුවන් ඇමුණුම 1 හි සඳහන් ගුරු පුරප්පාඩු පවතින පාසල් සඳහා පමණක් බඳවාගනු ලබන අතර එම පාසල්වල සේවය කිරීමට කැමති අය පමණක් මේ සඳහා ඉල්ලුම් කළ යුතු වේ.

*සටහන :*

ඉල්ලුම් කරනු ලබන පාසලේ පවතින විෂයයට අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි ඉල්ලුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක දී ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය මගින් ලබා ගන්නා ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙල අනුව හා පාසල් පාදකව ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත. එකම පාසලට ඉල්ලා ඇති ඉල්ලුම්කරුවන් කිහිප දෙනෙකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවක පාසලට ඇති දුර ප්‍රමාණය අනුව ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. එම නිර්ණායක මත සුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කරනු ඇත.

ඇමුණුම 1

**සිංහල මාධ්‍යය ගුරු පුරප්පාඩු ලේඛනය**

**ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය**

| *පළාත* | *අනුක්‍රමික අංකය* | *පාසලේ නම* | *ලිපිනය* | *ගුරු පුරප්පාඩු* |
|---|---|---|---|---|
| මධ්‍යම | 1 | අනුරුද්ධ කුමාර ජාතික පාසල | නාවලපිටිය | 1 |
| | 2 | ගාමිණී ජාතික පාසල | නුවරඑළිය | 1 |
| | 3 | රන්ගිරි දඹුල්ල ජාතික පාසල | දඹුල්ල | 1 |
| | 4 | ශ්‍රී සුමංගල ජාතික පාසල | නිල්දණ්ඩාහින්න | 1 |
| | 5 | රණසිංහ ප්‍රේමදාස ජාතික පාසල | හසලක | 1 |
| | 6 | හතරලියද්ද මධ්‍ය මහා විද්‍යාලය | හතරලියද්ද | 1 |
| | 7 | ඩී. බී. විජේතුංග ජාතික පාසල | මුරුතගහමුල | 1 |
| | 8 | ශ්‍රී නාග ජාතික පාසල | නාවුල | 1 |
| | 9 | ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලය | ගලේවෙල | 1 |
| | 10 | නාමිනිඔය මධ්‍ය මහා විද්‍යාලය | විල්ගමුව | 1 |
| | 11 | සුමන මහා විද්‍යාලය | තලවකැලේ | 1 |
| උතුරු මැද | 12 | ආනන්ද බාලිකා ජාතික පාසල | මින්නේරිය | 1 |
| | 13 | මින්නේරිය ජාතික පාසල | මින්නේරිය | 1 |
| | 14 | මැදිරිගිරිය ජාතික පාසල | මැදිරිගිරිය | 1 |
| | 15 | රුවන්වැලි මධ්‍ය මහා විද්‍යාලය | හොරොව්පතාන | 1 |

| පළාත | අනුක්‍රමික අංකය | පාසලේ නම | ලිපිනය | ගුරු පුරප්පාඩු |
|---|---|---|---|---|
| | 16 | ගල්නෑව මධ්‍ය මහා විද්‍යාලය | ගල්නෑව | 1 |
| | 17 | ගන්තිරියාගම මහින්ද මධ්‍ය මධ්‍ය මහා විද්‍යාලය | ඉපලෝගම | 1 |
| | 18 | ගල්කිරියාගම මධ්‍ය මහා විද්‍යාලය | ගල්කිරියාගම | 1 |
| | 19 | පලුගස්දමන මහා විද්‍යාලය | පලුගස්දමන, පොළොන්නරුව | 1 |
| | 20 | විලයාය මධ්‍ය මහ විද්‍යාලය | අරලගන්විල | 1 |
| | 21 | මහසෙන් මහ විද්‍යාලය | බකමූණ | 1 |
| | 22 | වැලිකන්ද මහ විද්‍යාලය | වැලිකන්ද | 1 |
| | 23 | ලීලාරත්න විජේසිංහ මහ විද්‍යාලය | හංසයාපාලම | 1 |
| | 24 | මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලය | මැදවච්චිය | 1 |
| | 25 | රාජකීය විද්‍යාලය | පොළොන්නරුව | 1 |
| | 26 | මිහින්තලේ මහා විද්‍යාලය | මිහින්තලේ | 1 |
| සබරගමුව | 27 | කලවාන ජාතික පාසල | කලවාන | 1 |
| | 28 | සිරිසමන් මධ්‍ය විද්‍යාලය | දැරණියගල | 1 |
| | 29 | ස්වර්ණජයන්ති මහා විද්‍යාලය | කුමාරතුංග මුණිදාස මාවත, කෑගල්ල | 1 |
| | 30 | කරවිට ජාතික පාසල | උඩකරවිට | 1 |
| | 31 | කොලොන්න ජාතික පාසල | කොලොන්න | 1 |
| | 32 | දෙහිඕවිට ජාතික පාසල | දෙහිඕවිට | 1 |
| | 33 | පින්නවල මධ්‍ය මහා විද්‍යාලය | රඹුක්කන | 1 |
| | 34 | විජේරිය සුමන මහා විද්‍යාලය | රක්වාන | 1 |
| ඌව පළාත | 35 | මහියංගණය ජාතික පාසල | මහියංගනය | 1 |
| | 36 | මීගහකිවුල ජාතික පාසල | මීගහකිවුල | 1 |
| | 37 | ශ්‍රී ජනානන්ද ජාතික පාසල | කදුරුගමුව, දියතලාව | 1 |
| | 38 | වලහපුතැන්න ජාතික පාසල | වල්හපුතැන්න, හල්දුම්මුල්ල | 1 |
| | 39 | වැලිමඩ මධ්‍ය මහා විද්‍යාලය | වැලිමඩ | 1 |
| | 40 | වෙල්ලස්ස ජාතික පාසල | වෙල්ලස්ස, හෙවෙල්වල, බිබිල | 1 |
| | 41 | මහානාම ජාතික පාසල | මොණරාගල | 1 |
| | 42 | නිශ්ශංක ජාතික පාසල | බඩල්කුඹුර | 1 |
| | 43 | මල්වත්තාවල මධ්‍ය මහා විද්‍යාලය | වැල්ලවාය | 1 |
| | 44 | ධර්මපාල මහා විද්‍යාලය | බණ්ඩාරවෙල | 1 |
| | 45 | ධර්මාශෝක මහ විද්‍යාලය | බණ්ඩාරවෙල | 1 |
| | 46 | මැදගම ජාතික පාසල | බිබිල | 1 |
| | 47 | දුටුගැමුණු ජාතික පාසල | බුත්තල | 1 |
| | 48 | මලිත්ත මහා විද්‍යාලය | පට්ටියගෙදර | 1 |
| | 49 | ජනාධිපති මහා විද්‍යාලය | අඹගස්දෝව | 1 |
| දකුණු පළාත | 50 | වීරකැටිය ජාතික පාසල | හම්බන්තොට | 1 |
| | 51 | කීර්ති අබේවික්‍රම ජාතික පාසල | දෙණියාය පාර, මොරවක | 1 |
| | 52 | දෙයියන්දර ජාතික පාසල | දෙයියන්දර | 1 |
| | 53 | මලිදූව මහ විද්‍යාලය | එරමුදුගොඩ, අකුරැස්ස | 1 |
| වයඹ පළාත | 54 | පැරකුම්පුර ජාතික පාසල | යාය 3 සෝලෙපුර | 1 |
| | 55 | ආනන්ද ජාතික පාසල | පුත්තලම | 1 |
| | 56 | කුඹුක්ගැටේ මධ්‍ය මහ විද්‍යාලය | කුඹුක්ගැටේ | 1 |
| | 57 | ජේ. ආර්. ජයවර්ධන ජාතික පාසල | කුලියාපිටිය | 1 |
| | 58 | මහසෙන් ජාතික පාසල | නිකවැරටිය | 1 |
| | 59 | මැදගම අභය විද්‍යාලය | මැදගම | 1 |
| උතුරු පළාත | 60 | මඩුකන්ද ජාතික පාසල | මඩුකන්ද, වව්නියාව | 1 |
| නැගෙනහිර පළාත | 61 | පොල්වත්ත මහ විද්‍යාලය | පොල්වත්ත ජනපදය - අම්පාර | 1 |
| | 62 | මැදගම මහ විද්‍යාලය, නවමැදගම | මහවැලි සී කලාපය - අම්පාර | 1 |
| | 63 | අභයපුර මහ විද්‍යාලය | අභයපුර, ත්‍රිකුණාමලය | 1 |
| | 64 | අග්බෝපුර මහ විද්‍යාලය | අග්බෝපුර, කන්තලේ | 1 |
| | 65 | කන්තලේ මහ විද්‍යාලය | කන්තලේ | 1 |

### දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු ලේඛනය

**ඉංජිනේරු තාක්‍ෂණවේදය විෂයය**

| පළාත | අනුක්‍රමික අංකය | පාසලේ නම | ලිපිනය | ගුරු පුරප්පාඩු |
|---|---|---|---|---|
| බස්නාහිර | 1 | අලුමුබාරක් ම. ම. වි. | මල්වාන | 1 |
| මධ්‍යම | 2 | අජ්මීර් ජාතික පාසල | උකුවෙල | 1 |
| | 3 | හින්දු ජාතික පාසල | නුවරඑළිය පාර, පුස්සැල්ලාව | 1 |
| | 4 | කදිරේෂන් ම. ම. වි. | කොත්මලේ පාර, නාවලපිටිය | 1 |
| | 5 | හොල්බෲක් දෙමළ ම. වි. | ආගරපතන | 1 |
| | 6 | නොර්වුඩ් දෙමළ ම. වි. | නොර්වුඩ් | 1 |
| | 7 | රාගල දෙමළ මහා විද්‍යාලය | හල්ග්‍රාන්ඔය | 1 |
| | 8 | කේම්බ්‍රිජ් විද්‍යාලය | කොටගල | 1 |
| දකුණ | 9 | අර්පා ජාතික පාසල | වැලිගම | 1 |
| | 10 | සහිරා ජාතික පාසල | හම්බන්තොට | 1 |
| වයඹ | 11 | කැකුණගොල්ල මුස්ලිම් ම. ම. වි. | ගිරිඋල්ල | 1 |
| | 12 | සහිරා ජාතික පාසල | පුත්තලම | 1 |
| ඌව | 13 | සරස්වතී ම. ම. වි. | මහියංගන පාර, බදුල්ල | 1 |
| | 14 | පස්සර දෙමළ ම. වි. | පස්සර | 1 |
| | 15 | හපුතලේ දෙමළ ම. වි. | හපුතලේ | 1 |
| සබරගමුව | 16 | අල්-අසාර් මුස්ලිම් ම. වි. | හෙම්මාතගම | 1 |
| උතුරු | 17 | මනිපායි හින්දු විද්‍යාලය | මනිපායි | 1 |
| | 18 | නෙල්ලිඅඩි ම. ම. වි. | කරවෙඩ්ඩි | 1 |
| | 19 | චාවකච්චේරි හින්දු විද්‍යාලය | චාවකච්චේරි | 1 |
| | 20 | යාපනය හින්දු විද්‍යාලය | යාපනය | 1 |
| | 21 | වේම්බඩි උසස් බාලිකා විද්‍යාලය | යාපනය | 1 |
| | 22 | වෙලානි ම. ම. වි | වෙලානි | 1 |
| | 23 | වඩ්ඩු හින්දු විද්‍යාලය | සිතන්කර්නි | 1 |
| | 24 | වයවිලාන් ම. ම. වි. | වයවිලාන් | 1 |
| | 25 | ශ්‍රී සෝමාස් කන්ද විද්‍යාලය | පුතුර් | 1 |
| | 26 | මෙතොදිස් උසස් බාලිකා විද්‍යාලය | පේදුරු තුඩුව | 1 |
| | 27 | කිලි/කිලිනොච්චි ම. ම. වි. | A9 පාර, බටහිර ආනන්දපුරම්, කිලිනොච්චිය | 1 |
| | 28 | කිලිනොච්චි හින්දු විද්‍යාලය | ජාන්තිනගර්, කිලිනොච්චිය | 1 |
| | 29 | එරුක්කම්පිඩ්ඩි මුස්ලිම් ම. ම. වි. | එරුක්කම්පිඩ්ඩි, මන්නාරම | 1 |
| | 30 | මන්/මුරුන්කන් ම. වි. | මුරුන්කන්, මන්නාරම | 1 |
| | 31 | මු/විද්‍යානන්ද විද්‍යාලය | මුල්ලියාවේලෙයි | 1 |
| | 32 | ඔඩ්ඩුසුඩාන් ම. වි. | විද්‍යාපුරම්, ඔඩ්ඩුසුඩාන් | 1 |
| | 33 | ව/වෙඩ්ඩිකුලම් ම. වි. | වෙඩ්ඩිකුලම් | 1 |
| | 34 | වව්නියා දෙමළ ම. ම. වි. | වව්නියාව | 1 |
| | 35 | තර්මාපුරම් මධ්‍ය මහා විද්‍යාලය | පරන්තන් | 1 |
| නැගෙනහිර | 36 | මඩ/ඔඩ්ඩමාවඩි ම. ම. වි. (ජා. පා.) | ඔඩ්ඩමාවඩි | 1 |
| | 37 | මඩ/වාලච්චේනෙයි අන්නූර් ම. වි. | වාලච්චේනෙයි | 1 |
| | 38 | මඩ/කාත්තන්කුඩි ම. ම. වි. | 322, වෙරළ පාර, නව කාත්තන්කුඩ්ඩි - 06 | 1 |
| | 39 | සහිරා විද්‍යාලය (ජා. පා.) | සහිරා විද්‍යාල පාර, ආයින්තමරුතු | 1 |
| | 40 | අක්කරෙයිපත්තු මුස්ලිම් ම. ම. වි. | අක්කරෙයිපත්තු | 1 |
| | 41 | අඩ්ඩාලච්චේනෙයි ම. ම. වි. | මහ වීදිය, අඩ්ඩාලච්චේනෙයි | 1 |
| | 42 | ශ්‍රී රාමක්‍රිෂ්ණ විද්‍යාලය | අක්කරෙයිපත්තු | 1 |
| | 43 | ත්‍රි/මු/මුතූර් ම. ම. වි. | නොක්ස් පාර, මුතූර් | 1 |
| | 44 | මඩ/කිරාන් ම. වි. | කිරාන් | 1 |
| | 45 | මඩ/චන්දාරමූලෙයි ම. ම. වි. | සිත්තන්ඩි - 1 | 1 |
| | 46 | මඩ/හින්දු විද්‍යාලය | මඩකලපුව | 1 |
| | 47 | විපුලානන්ද විද්‍යාලය | නුවර පාර, ත්‍රිකුණාමලය | 1 |

03. *අයදුම්කිරීමේ ක්‍රමය* :

3.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයේ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් සකස් කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර ද අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) සම්පූර්ණ කරනු ලබන අයදුම් පත්‍රය මෙම නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

3.2 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

3.3 නිවැරිදිව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍ර 2014.09.15 දිනට හෝ ඊට පෙර, "ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ඉංජිනේරු තාක්‍ෂණවේදය විෂයය සඳහා පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා තාක්‍ෂණික ඩිප්ලෝමාධාරීන් ගුරුවරුන් ලෙස බඳවා ගැනීම" ලෙස අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතුය.

3.4 සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

4. දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන් අයදුම්පත්‍රයේ අංක 7.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

5. සම්මුඛ පරීක්ෂණය සඳහා නියමිත දිනයේ දී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව පසුව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

6. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

7. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

අනුර දිසානායක,<br>
ලේකම්,<br>
අධ්‍යාපන අමාත්‍යාංශය.

2014 අගෝස්තු මස 15 වැනි දින,<br>
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

*අධ්‍යාපන අමාත්‍යාංශය*

*ආදර්ශ අයදුම්පත්‍රය*

[ ]

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**අ.පො.ස. (උසස් පෙළ) නව තාක්ෂණ විෂය ධාරාවේ ඉංජිනේරු තාක්‍ෂණවේදය විෂයය සඳහා පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා තාක්‍ෂණික ඩිප්ලෝමාධාරීන් ගුරුවරුන් ලෙස බඳවා ගැනීම**

ඉංජිනේරු තාක්‍ෂණවේදය විෂයය [ ]

සිංහල මාධ්‍යය [ ]<br>
දෙමළ මාධ්‍යය [ ]

(තමා ඉල්ලුම් කරනු ලබන විෂයය හා මාධ්‍යය සඳහා ✓ ලකුණ යොදන්න)

| *අනුක්‍රමික අංකය* | *පළාත* | *පාසලේ නම* |
|---|---|---|
| | | |

(ඇමුණුම 1 හි සඳහන් අයුරින් ඉල්ලුම් කරනු ලබන පාසල හා අනුක්‍රමික අංකය මෙහි ලියන්න)

01.

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා : PERERA A. B.) :————.

1.2 මුලකුරුවලින් දැක්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(කැඳවීම් ලිපි මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

03.

3.1 ස්ත්‍රී/පුරුෂ භාවය ☐ (ස්ත්‍රී 1 පුරුෂ 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව : අවිවාහක 1- විවාහක - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.4 2014.09.15 දිනට වයස : අවු ☐☐ මාස ☐☐ දින ☐☐

3.5 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

04. *අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :*

| අ.පො.ස. (සා.පෙළ) විභාගය | අ.පො.ස. (උ.පෙළ) විභාගය |
|---|---|
| වර්ෂය :<br>විභාග අංකය : | වර්ෂය :<br>විභාග අංකය : |
| ...............................................<br>...............................................<br>...............................................<br>...............................................<br>...............................................<br>...............................................<br>...............................................<br>...............................................<br>...............................................<br>............................................... | ...............................................<br>...............................................<br>...............................................<br>............................................... |

05. *උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :*

5.1 ඩිප්ලෝමාව :————.

5.2 නිකුත් කළ ආයතනය :————.

5.3 වලංගු දිනය :————.

5.4 හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් :————.

5.5 ඩිප්ලෝමාව ලබා ඇති මාධ්‍යය :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරා ගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මම දනිමි. තව ද ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පත්වීම් බලධරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

06. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන......................මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ........... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

————,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

07. අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

...................... මහතා/මහත්මිය/මෙනෙවියගේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

08-665/2

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය හා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය හා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය හා සියලු සේවාවල නිලධාරීන් සඳහා වන දෙවන භාෂාව පිළිබඳ පරීක්‍ෂණය - 2014 (1)**

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය හා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය හා සියලු සේවාවල නිලධාරීන් සඳහා වන දෙවන භාෂාව පිළිබඳ පරීක්‍ෂණය 2014 (1), රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අධීක්‍ෂණය සහ මෙහෙයවීම යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල් විසින් 2014 සැප්තැම්බර් මස 06 සිට 2014 සැප්තැම්බර් මස 14 දින දක්වා සති අන්ත දිනවලදී කොළඹ දී පවත්වනු ලබන බවත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය 2014 ඔක්තෝබර් මස දී පැවැත්වෙන බවත් (විභාගය පැවැත්වෙන දිනය පසුව දැනුම්දෙනු ලැබේ.) මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. ඉහත සේවාවන්ට අදාළව පැවැත්වීමට නියමිත කාර්යක්‍ෂමතා කඩඉම් විභාග සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්‍ෂණ පහත සඳහන් පරිදි වේ.

| *අනු. අංකය* | *විභාගයේ නම* | *සංකේත නාමය* |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන භාෂාව පිළිබඳ පරීක්‍ෂණය | SLAS 1 |
| 02. | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන භාෂාව පිළිබඳ පරීක්‍ෂණය | SLES |
| 03. | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන භාෂාව පිළිබඳ පරීක්‍ෂණය | SLSS |
| 04. | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන භාෂාව පිළිබඳ පරීක්‍ෂණය | SLArS |
| 05. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | SLAS 2 |

03. තමා කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතෙකුදු වුවත් නියම කර ඇති කාලසීමාව තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම අත්‍යාවශ්‍ය වේ.

04. මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

05. මෙම විභාගය සඳහා අයදුම් කිරීම අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමයට (Online) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.slida.lk වෙත පිවිසීමෙන් පමණක් කළ හැක. වෙබ් අඩවියේ මුල් පිටුවේ දකුණු පස තීරුවේ "Apply Online" වශයෙන් තිබෙන කොටසට පිවිස තමාට අදාල විභාගය තෝරා ගැනීමෙන් විභාග අයදුම්පත සම්පූර්ණ කළ හැක.

විභාග අයදුම්පත සම්පූර්ණ කිරීම 2014 අගෝස්තු 15 දින පෙ. ව. 8.00 සිට 2014 අගොස්තු 29 දින රාත්‍රී 12.00 දක්වා වන කාලය තුළ පමණක් සිදු කළ හැක.

06. *විභාග ගාස්තු* - පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. මීට පෙර විභාගයට අයදුම්කර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් විභාග ප්‍රවේශ පත්‍රයක් ද නිකුත් කරනු ලදුව විභාගයට පෙනී නොසිටිය ද එය විභාගයට පෙනී සිටි වාරයක් ලෙස සැලකිය යුතුය.

මීට පෙර විභාගයට පෙනී සිටි නිලධාරීන් පහත පරිදි විභාග ගාස්තු ගෙවිය යුතු වේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන භාෂා පරීක්ෂණය එක් විභාගයක් ලෙසත්, දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය තවත් විභාගයක් ලෙසත් සලකා විභාග ගාස්තු ගෙවිය යුතු ය. ඒ අනුව පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ හා දෙවන භාෂා පරීක්ෂණයේ එක් විෂයයකට වඩා අයදුම් කරන්නේ නම් රු. 1,000 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ හා දෙවන භාෂා පරීක්ෂණයේ එක් විෂයයකට පමණක් පෙනී සිටින්නේ නම් රු. 500ක විභාග ගාස්තුවක් ද ගෙවිය යුතු වේ. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ එක් විෂයයකට වඩා අයදුම් කරන්නේ නම් රු. 1,000 ක විභාග ගාස්තුවක් ද, විෂයයකට පමණක් පෙනී සිටින්නේ නම් රු. 500 ක විභාග ගාස්තුවක් ද ගෙවිය යුතු වේ.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ හා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ සහ දෙවන භාෂා පරීක්ෂණයේ එක් විෂයයකට වඩා අයදුම් කරන්නේ නම් රු. 1,000 ක් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු ය. එක් විෂයයකට පමණක් පෙනී සිටින්නේ නම් රු. 500 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු ය.

විභාග ගාස්තු ශ්‍රී ලංකාව පුරා පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (උප තැපැල් කාර්යාල හැර) "SLIDA " ගිණුම වෙත ගෙවිය යුතු අතර ඒ ගෙවීමට අදාළව ලබාදෙන රිසිට් පතේ අංකය විභාග අයදුම්පතේ අදාළ ස්ථානයන්හි ඇතුළත් කළ යුතු ය. අදාළ තැපැල් කාර්යාලයේ දී " SLIDA" ගිණුම වෙත මුදල් ගෙවීමේ මෙරට විදුලි මුදල් ඇණවුම් ඉල්ලුම් පත්‍රය (තැ. කා. සි. 85) පිරවීමේ දී මුදල් ලබා ගන්නා ලෙස " SLIDA" යන්න ද, මුදල් ලබන්නාගේ ලිපිනය යන ස්ථානයේ ඔබට අදාළ විභාගයේ සංකේත නාමය ද සටහන් කරන්න. (සංකේත නාමයන් 02 වගන්තියේ දක්වා ඇති පරිදි විය යුතු ය.)

තව ද, ගිණුම වෙත මුදල් ගෙවීමේ දී මුදල් යවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, මුදල් යවන්නාගේ ලිපිනය යන ස්ථානයේ අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, ඇතුළත් කර ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු ය.

07. *ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ හා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා සියළුම සේවාවන් සඳහා වන දෙවන භාෂා පරීක්ෂණය සඳහා වන විභාග ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම-*

Online ක්‍රමයට සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර Submit කළ පසු අදාළ අයදුම්කරු වෙත තහවුරු කිරීමේ අංකයක් (Confirmation Number) ලබා දෙනු ලබන අතර, එය ඉදිරි විමසීම් කටයුතු සඳහා අයදුම්කරු වෙත තබාගත යුතුවේ. අයදුම්කරුවන් විසින් නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත්‍රය මාර්ගගතව (Online) යොමු කිරීමෙන් අනතුරුව ලැබෙන වෙබ් පිටුවේ ඇති උපදෙස් අනුගමනය කිරීමෙන් තමාට හිමි විභාග ප්‍රවේශ පත්‍රය ලබා ගැනීමට ඉඩ සැලසෙනු ඇත. එම ප්‍රවේශ පත්‍රය මුද්‍රණය කර දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු/ඇය විසින් ස්වකීය බලය පැවරූ නියෝජ්‍ය නිලධාරියකු වෙතින් තම අත්සන සහතික කරගත යුතුවේ. එසේ සහතික කරගත් විභාග ප්‍රවේශ පත්‍ර විභාගශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ සහතික කරන ලද විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් විභාග අපේක්ෂකයන් විසින් තම පෞද්ගලික ලිපිගොනුවේ ඇතුලත් කිරීම සඳහා සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලබා දිය යුතුය.

08. *ශ්‍රී ලංකා පරිපාලන සේවයේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විභාග ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම-*

විභාග ප්‍රවේශ පත්‍රය අයදුම්කරුවන්ගේ විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail) වෙත පසුව යොමු කරනු ලබන අතර ඒ බව අයදුම්කරුගේ ජංගම දුරකථනය වෙත කෙටි පණිවඩයක් ( SMS) මගින් ද දැනුම් දෙනු ලැබේ. එබැවින් නිවැරදි විද්‍යුත් ලිපිනය සහ ජංගම දුරකථන අංකය විභාග අයදුම්පතෙහි අදාළ කොටසෙහි ඇතුළත් කිරීමට සැලකිලිමත් වන මෙන් අවධාරණය කරනු ලැබේ.

09. අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් ගැටලුවක් මතු වුවහොත් ඒ පිළිබඳ විමසීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 011-5980236 යන දුරකථන අංකය 2014.08.15 දින සිට 2014.08.29 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ. ව. 08.30 සිට ප. ව. 4.30 දක්වා විවෘතව ඇත.

10. විභාග ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු දිය යුතු ය. අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය තහවුරු කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-5980236 ඔස්සේ ඒ බව තහවුරු කර ගත හැකි ය. විභාගයට පැමිණීම වෙනුවෙන් ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.-* අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් ම පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් අභිමතය පරිදි අවලංගු කළ හැකි ය.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර යම් අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13. *විභාග පරිපාටිය.-*එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් සහ විෂයය නිර්දේශයන් පහත සඳහන් පරිදි වේ.

13.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (අංක 1419/3 දරන 2005.11.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඇ' පරිශිෂ්ඨය)

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ :

| *අනු. අංකය* | *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|
| 01. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | පැය 03 යි | 01 |
| 02. | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | පැය 03 යි | 02 |
| 03. | අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | පැය 03 යි | 03 |
| 04. | පරිපාලනය | පැය 03 යි | 04 |
| 05. | ආර්ථික විද්‍යාව | පැය 03 යි | 05 |
| 06. | සමාජ විද්‍යාව | පැය 03 යි | 06 |
| 07. | ඉංග්‍රීසි | පැය 03 යි | 07 |

13.1.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය (විෂයය අංකය 01)
*පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි*
(i) ඓතිහාසික සංවර්ධනය ද ඇතුලුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහය හා දෙවන ජනරජ ව්‍යවස්ථාව,
(ii) විධායකය, ජනරජයේ ජනාධිපති, අමාත්‍ය මණ්ඩලය හා අගමැති, මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සේවය,
(iii) යුක්තිය පසිඳලීම,
(iv) පරිපාලනය සම්බන්ධ අධිකරණ පාලනය,
(v) රාජ්‍ය ප්‍රතිපත්තිය උදෙසා මාර්ගෝපදේශ ප්‍රතිපත්ති සහ මූලික යුතුකම්,
(vi) අභිනියෝජන ව්‍යවස්ථා,
(vii) රජයේ හා රාජ්‍ය අධිකාරීන් හි වගකීම්,
(viii) මූලික අයිතිවාසිකම්.

13.1.2 ශ්‍රී ලංකාවේ නීති ක්‍රම (විෂයය අංකය 02)
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි.
(i) ශ්‍රී ලංකාවේ නීති ඉතිහාසය,
(ii) අධිකරණ සංවිධානය,
(iii) ශ්‍රී ලංකාවේ උසාවි ආඥාපනත (6 පරිච්ඡේදය),
(iv) 1971 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත.

13.1.3 අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය (විෂයය අංකය 03)
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි.
(i) දණ්ඩ නීති සංග්‍රහය,
(ii) සාක්ෂි ආඥාපනත.

*සටහන.*-අපේක්ෂකයකු ඉහත 13.1.1, 13.1.2 සහ 13.1.3 හි සඳහන් එක් එක් විෂයය සඳහා අවම වශයෙන් 35%ක ලකුණු ප්‍රමාණයක් සහ විෂයයන් 03හි මුළු ලකුණු වලින් 40%ක සාමාන්‍යයක් ලබා ගත යුතු වේ.

13.1.4 පරිපාලනය (විෂයය අංකය 04)
*පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි :-*
(i) කාර්යාල සහ ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම,
(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති සහ 1589/30 අංක දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කාර්ය පටිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII.

*සටහන.*- මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.1.5 ආර්ථික විද්‍යාව (විෂය අංකය 05)/ සමාජ විද්‍යාව (විෂය අංකය 06)
අපේක්ෂකයන් ආර්ථික විද්‍යා හෝ සමාජ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයකට පමණක් පෙනී සිටිය යුතුය.

13.1.5.1 ආර්ථික විද්‍යාව (විෂය අංකය 05) :
*පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි* :-
(i) වටිනාකම, නිෂ්පාදනය හා බෙදා හැරීමේ න්‍යායන් පිළිබඳ විශේෂ අවධානයක් සහිතව ආර්ථික විද්‍යාවේ මූලධර්ම,
(ii) මුදල්, මූල්‍ය කටයුතු හා මුදල් න්‍යාය,
(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය.

*සටහන.*- මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.1.5.2 සමාජ විද්‍යාව (විෂය අංකය 06) :

ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ අවධානය සහිතව පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. :-

(i) සමාජ ව්‍යුහය, සංවිධානය හා කාර්යයන්,
(ii) මානව සම්බන්ධතා හා කණ්ඩායම්,
(iii) බන්ධුත්වය, විවාහය හා පවුල,
(iv) ග්‍රාමීය හා නාගරික සමාජය,
(v) සමාජ ස්ථරායනය හා විභේදනය,
(vi) සමාජයීය පාලනය,
(vii) සංස්කෘතිය, ආගම, සදාචාරය හා හර පද්ධතීන්.

*සටහන* : මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.1.6 ඉංග්‍රීසි (විෂය අංකය 07) :

මෙම විෂයය සඳහා අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ.

(i) *Listening and Speaking Skills*.—The candidate should possess the ability to function effectively in the following language functions :
* General Greetings and Introductions,
* Giving and Getting Information,
* Advising, Suggesting and Expressing Opinions,
* Describing Events and Situations,
* Telephone Skills,
* Interviewing Skills,
* Meeting,
* Listening and Note Talking skills.

(ii) *English Grammer*.—A suitable level of proficiency on the following forms of grammar in the Spoken the Written Language is expected from the candidate :
* Tense and Numbers,
* Sentences (Simple/Compound/Complex/Compound Complex),
* Relative Clauses,
* Reported Speech,

* Adjectives and Adverbs,
* Determiners,
* Prepositions.

(iii) *Writing Skills.*—The knowledge on the modern formats and styles of writing is tested in this area of study.
* Internal modes of Communication,
* Formal Correspondence Skills,
* Writing Descriptions/Explanations,
* Summary Writing Skills,
* Report Writing Skills,
* Meeting Minutes/Agendas/Invitations,
* Comprehension.

(iv) *Reading Skills.*—Candidate's ability to comprehend a printed text, infer meaning and verbal/written interpretation is expected.
* Reading and understanding the specific and general meaning of a printed text,
* Reading and Interpretation (Verbal/Written),
* Understanding the cohesion and coherence of a passage.

***සටහන.*** – මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.2 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය : (අංක 1419/3 දරන 2005.11.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඇ' පරිශිෂ්ඨය)

මෙම විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

| *අනු. අංකය* | *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|
| 01 | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | පැය 03 යි | 08 |
| 02 | සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | පැය 03 යි | 09 |
| 03 | කළමනාකරණය හා සංවිධාන ක්‍රම | පැය 03 යි | 10 |
| 04 | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | පැය 03 යි | 11 |

**13.2.1 ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (විෂයය අංකය 08) :**

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා බලපාන කරුණු මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි. ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික, සමාජ හා දේශපාලන ඉතිහාසය තුළ ආර්ථික විද්‍යා සහ සමාජ විද්‍යා මූලධර්මයන් උපයෝගී කරගත් ආකාරය පිළිබඳ කරුණු මත මෙම ප්‍රශ්න පත්‍රය සකස් වී ඇත.

***සටහන.***– මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

13.2.2 සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (විෂයය අංකය 09) :

ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානයක් සහිතව පහත කරුණු පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් සංවර්ධන පරිපාලනය භාර වූ ආයතන, ඒවායේ ක්‍රියාකාරීත්වය හා අන්තර් සම්බන්ධතාවයන් මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි. :-

(i) ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රය,
(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පසුබිම,
(iii) පළාත් සභා හා පළාත් පාලන,
(iv) මහජන සංවිධාන,
(v) රාජ්‍ය සංස්ථා.

***සටහන.***- මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

13.2.3 කළමනාකරණය හා සංවිධාන ක්‍රම (විෂයය අංකය 10)

*පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. :*

(i) කළමනාකරණය හා සංවිධානය පිළිබඳ මූලධර්ම,
(ii) එම මූලධර්ම රාජ්‍ය අංශයේ පැන නගින ගැටළු හා ප්‍රශ්නවලට අදාළ කර ගැනීම,
(iii) කළමනාකරණය පිළිබඳ නූතන ක්‍රමවේදයන් හා ශිල්ප ක්‍රම.

***සටහන.***- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.2.4 රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (විෂයය අංකය 11) :

*පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි :*

(i) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය—
රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන
රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය
අරමුදල් යන්නෙහි අර්ථය
ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරිත්වය
විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම
අවිනිශ්චිත අවස්ථා අරමුදල
වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරිත්වය
රාජ්‍ය ආදායම
මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යය භාරය, භාණ්ඩාගාරයේ බලතල හා කාර්ය භාරය
වොරන්ට් සහ අග්‍රිම අධිකාරිය
විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය
රාජ්‍ය වියදම් කමිටුව
රාජ්‍ය ව්‍යාපාර කමිටුව;

(ii) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ ගිණුම් නිලධාරීන් පත් කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්ය;

(iii) අභ්‍යන්තර විගණනය;

(iv) රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණය—
සංවිධානවල අරමුණු හා කාර්ය භාරයන් හඳුනා ගැනීම
රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩ සටහන් හඳුනා ගැනීම
සංවර්ධන ව්‍යාපෘති, වැඩ සටහන් සැලසුම් කිරීම හා ඇගයීම හා ප්‍රමුඛතාකරණය
වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම;

(v) අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම—
වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම
රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය
මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම
පරිපූරක ඇස්තමේන්තු;

(vi) රජයේ දේපළවල පාඩු හා අත්හැරීම්;

(vii) විවිධ ගිණුම් කටයුතු;

(viii) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්ය භාරයන් පැවරීම;

(ix) රජයේ මුදල්වල හා භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය

(x) රජයේ සැපයුම් ක්‍රියා පටිපාටිය—
භාණ්ඩ සේවා හා වැඩ ලබා ගැනීම
ටෙන්ඩර් මණ්ඩල හා තාක්ෂණ ඇගයුම් කමිටුවල සංයුතිය
පත්කිරීම බලතල හා කාර්ය භාරය

ටෙන්ඩර් ඇගයීමේ ක්‍රියා පටිපාටිය
විදේශ ආධාර මත ක්‍රියාත්මකවන ව්‍යාපෘතිවල කළමනාකරණය.

***සටහන.***- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.3 ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (2013.11.11 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ iii උපලේඛනය)

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (1988.06.07 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'අ' පරිශිෂ්ඨය) සහ

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (1995.08.31 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ii උපලේඛනය)

මෙම විභාගයන් සඳහා වන විෂයයන් පහත දැක්වේ. :-

| *විෂයය* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|
| මූල්‍ය ක්‍රම | පැය 03 යි | 12 |
| පරිපාලනය | පැය 03 යි | 04 |

13.3.1 මූල්‍ය ක්‍රම (විෂය අංකය 12)

පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. :—

(i) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (X වැනි පරිච්ඡේදය හැර),
(ii) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තු උදා : ඒවා සකස් කිරීම, ශීර්ෂ මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්

***සටහන.***- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.3.2 පරිපාලනය (විෂය අංකය 04)

පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. :—

(i) කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම,
(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති සහ 1589/30 අංක දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කාර්ය පටිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII

***සටහන.***- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.4 සියලු සේවාවල නිලධාරීන් සඳහා දෙවන භාෂා පරීක්ෂණය

මෙම විභාගයන් ලිඛිත පරීක්ෂණය සහ වාචික පරීක්ෂණය යන කොටස් දෙකකින් යුක්ත වේ. ලිඛිත විභාගය සමත් වන අයදුම්කරුවන් පමණක් අදාල විෂයයට අනුරූප වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත්වීම සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් ලකුණු 40%ක් ගත යුතුයි. ලිඛිත පරීක්ෂණය සඳහා වන විෂයයන් පහත දැක්වේ. :

| *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|
| දෙවන භාෂා පරීක්ෂණය - සිංහල | පැය 02යි | 13 |
| දෙවන භාෂා පරීක්ෂණය - දෙමළ | පැය 02යි | 14 |
| දෙවන භාෂා පරීක්ෂණය - ඉංග්‍රීසි | පැය 02යි | 15 |

***සටහන.***—සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු සම්බන්ධයෙන් දෙවන භාෂාව දෙමළ භාෂාව වන අතර, දෙමළ මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු සම්බන්ධයෙන් දෙවන භාෂාව සිංහල භාෂාව වේ. ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු සිංහල හා දෙමළ යන භාෂා දෙක පිළිබඳ පරීක්ෂණවලින් සමත් විය යුතු ය.

14. මෙම විභාගය සඳහා වන විභාග කාල සටහන පහත පරිදි වේ :—

| අනු. අංකය | විභාගයේ නම | විෂයය | විෂයය අංකය | දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | 01 | 2014.09.06 | 09.00-12.00 |
| | | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | 02 | 2014.09.06 | 13.00-16.00 |
| | | අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | 03 | 2014.09.07 | 09.00-12.00 |
| | | පරිපාලනය | 04 | 2014.09.07 | 13.00-16.00 |
| | | ආර්ථික විද්‍යාව | 05 | 2014.09.13 | 09.00-12.00 |
| | | සමාජ විද්‍යාව | 06 | 2014.09.13 | 09.00-12.00 |
| | | ඉංග්‍රීසි | 07 | 2014.09.13 | 13.00-16.00 |
| 02. | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 12 | 2014.09.07 | 9.00-12.00 |
| | | පරිපාලනය | 04 | 2014.09.07 | 13.00-16.00 |
| 03. | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 12 | 2014.09.07 | 9.00-12.00 |
| | | පරිපාලනය | 04 | 2014.09.07 | 13.00-16.00 |
| 04. | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 12 | 2014.09.07 | 9.00-12.00 |
| | | පරිපාලනය | 04 | 2014.09.07 | 13.00-16.00 |
| 05. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති | 08 | පසුව දැනුම් දෙනු ලැබේ. | |
| | | සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය | 09 | | |
| | | කළමනාකරණය හා සංවිධාන ක්‍රම | 10 | | |
| | | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | 11 | | |
| 06. | සියලු සේවාවන්වල නිලධාරීන් සඳහා වන දෙවන භාෂාව පිළිබඳ පරීක්‍ෂණය | දෙවන භාෂා පරීක්‍ෂණය - සිංහල | 13 | 2014.09.14 | 9.00 - 11.00 |
| | | දෙවන භාෂා පරීක්‍ෂණය - දෙමළ | 14 | 2014.09.14 | 11.30 - 13.30 |
| | | දෙවන භාෂා පරීක්‍ෂණය - ඉංග්‍රීසි | 15 | 2014.09.14 | 14.00-16.00 |

15. 15.1 කාර්යක්ෂමතා කඩඉම් පරීක්‍ෂණය සහ දෙවන භාෂා පරීක්ෂණයට අදාළ විෂයයන්ගේ සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම පහත පරිදි වේ :—

| විභාගය | විෂයය | නිදහස් කරනු ලැබීමට අවශ්‍ය සුදුසුකම් |
|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂා පරීක්ෂණය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | බැරිස්ටර්වරයෙකු, ශ්‍රේෂ්ඨාධිකරණයේ අධි නීතිඥවරයකු, විශ්වවිද්‍යාලයක නීතිය පිළිබඳ උපාධිධාරියකු වීම. |
| | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | |
| | අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | |
| | ආර්ථික විද්‍යාව/සමාජ විද්‍යාව | ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව පිළිබඳව උපාධිධරයකු වීම. |
| | දෙවන භාෂා පරීක්ෂණය සිංහල<br>දෙවන භාෂා පරීක්ෂණය දෙමළ | (i) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් පළමු භාෂාව හෝ දෙවන භාෂාව සමත්වීම;<br>(ii) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූලික හෝ උසස් භාෂා පාඨමාලාවක් සමත්වීම;<br>(iii) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රාරම්භක හෝ ඉහළ මට්ටමක භාෂා පාඨමාලාවන් සමත්වීම;<br>(iv) අ. පො. ස. (සා. පෙළ) වෛකල්පිත සිංහල හෝ දෙමළ විෂයයෙන් සමත් වී තිබීම. |
| | දෙවන භාෂා පරීක්ෂණය ඉංග්‍රීසි | අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය හෝ ඊට වැඩි සාමාර්ථ්‍යයක් ලබා තිබීම. |

***සටහන.***—2012.01.02 සහ ඊට පසු බඳවා ගනු ලබන නිලධාරීන්ගේ පත්වීම් ලිපිවල විධිවිධාන පරිදි, අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම සඳහා මෙම විභාග නිවේදනයෙහි සඳහන් දෙවන භාෂා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවශ්‍ය නොවන අතර, එම නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි සඳහන් විධිවිධාන අනුව එම ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

15.2 රාජ්‍ය සේවා කොමිෂන් සභාව දන්වා ඇති පරිදි 2012.07.01 වැනි දින සිට 2015.01.01 වැනි දින දක්වා බඳවා ගනු ලැබූ/ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවල විෂයයන් සමත්වීම මත අංක 1842/2 හා 2013.12.23 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව හැදෑරිය යුතු විෂයයන්ගෙන් පහත පරිදි නිදහස් විය යුතු ය. :-

| *මෙම ගැසට් පත්‍රයේ සඳහන් විෂයය* | *2013.12.23 දිනැති සේවා ව්‍යවස්ථාවේ සඳහන් විෂයය* |
|---|---|
| ආර්ථික විද්‍යාව (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| සමාජ විද්‍යාව (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| ඉංග්‍රීසි (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | සන්ධාන භාෂා ප්‍රවීණතාව (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |

16. ප්‍රතිඵල නිකුත් කිරීම, මෙම විභාගයට අයදුම් කළ/පෙනී සිටි සියලු අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ. ඉලෙක්ට්‍රොනික ලේඛන හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය පිළිබඳව වූ ජනාධිපති ලේකම්ගේ අංක SP/SB/1/13 හා 2009.10.13 දිනැති චක්‍රලේඛය අනුව අමාත්‍යාංශ වෙබ් අඩවියේ සඳහන් ප්‍රතිඵල පළ කිරීම නිලධාරීන්ට ප්‍රතිඵල නිකුත් කිරීමක් ලෙස සැලකිය යුතු ය. මේ අනුව දෙපාර්තමේන්තු ප්‍රධානීන් අමාත්‍යාංශ වෙබ් අඩවියේ සඳහන් ප්‍රතිඵල ලේඛනවල අදාළ පිටපත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවලට ඇතුළත් කළ යුතු ය. ප්‍රතිඵල නැවත සමීක්ෂණයට අවසර දෙනු නොලැබේ.

17. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතු ය.

18. මෙම විභාග නිවේදනයට විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2014 ක් වූ අගෝස්තු මස 01 වැනි දින,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

08-661

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**ඉස්ලාම් ආගමික අහදිය්‍යා අල් කුර්ආන් පාසල් සඳහා වූ අවසන් සහතික පත්‍ර විභාගය - 2014**

(බෞද්ධ දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය හා සමාන විභාගයකි)

*නීතිරීති හා ව්‍යවස්ථා* :

1. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ඉහත සඳහන් විභාගය, 2014 නොවැම්බර් මාසය තුළ පැවැත්වීමට කටයුතු යොදා ඇත. එම විභාගය සඳහා වූ විෂය නිර්දේශ, ඇමුණුම 01 හි සඳහන් වේ.

2. *විභාග මධ්‍යස්ථාන* :

එක් එක් දිස්ත්‍රික්කයෙන් පෙනී සිටීමට නියමිත අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව ඇමුණුම 02හි සඳහන් නගරවල විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ.

එහෙත් යම්කිසි විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථාන අවලංගු කර එම අයදුම්කරුවන් ඊට ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ.

3. *භාෂා මාධ්‍යය* :
මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

4. *සුදුසුකම්* :
මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ සම්පූර්ණ කර තිබිය යුතුය. :-

4.1 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද අහදිය්‍යා දහම් පාසලක 10 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන අයෙකු වීම;

*හෝ*

4.2 මුස්ලිම් ආගමික හෝ සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද අල්කුර් ආන් මද්රසා විෂය නිර්දේශය සම්පූර්ණ කරන ලද අයෙකු වීම;

*හෝ*

4.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අ. පො. ස. (සා. පෙළ) විභාගයේ ඉස්ලාම් සහ අරාබි විෂයයන්ගෙන් සාමාර්ථ්‍යය ලත් අයෙකු වීම.

*සටහන* :

1. මෙම විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු ම ඉහත 4 වැනි ඡේදයේ සඳහන් කර ඇති සුදුසුකම් ලබා ඇති බවට අහදිය්‍යා දහම් පාසලේ විදුහල්පති හෝ අල්කුර් ආන් මද්රසාවේ ජ්‍යෙෂ්ඨ විදුහල්පති හෝ පාසලේ විදුහල්පති හෝ සහතික කළ යුතු වේ.

2. සෑම අයදුම්කරුවකු ම මෙම විභාගයට ලියාපදිංචි කළ අහදිය්‍යා පාසල හෝ ජ්‍යෙෂ්ඨ අල් කුර්ආන් මද්රසාවේ හෝ පාසලේ විදුහල්පති හෝ මගින් පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

5. ලියාපදිංචි කළ සියලු ම අහදිය්‍යා දහම් පාසල්, මද්රසා පාසල් වෙත ඉල්ලුම්පත් හා උපදෙස් පත්‍රිකා තැපැල් මගින් යවා ඇති අතර, එසේ නොලැබුණු ආයතන වෙතොත් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට අයදුම්කරුවන් සංඛ්‍යාව සඳහන් කළ ලිපියක් 2014 අගෝස්තු මස 29 වැනි දිනට පෙර එවීමෙන් අයදුම්පත්‍ර හා උපදෙස් පත්‍රිකා ලබාගත හැක.

5.1 සියලුම ඉල්ලුම්පත් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුල් පිටපත විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු අතර, අනෙක් පිටපත අදාළ ආයතනයේ ගොනුකර තැබිය යුතුය.

5.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය 2014 සැප්තැම්බර් මස 15 වැනි දින වේ.

5.3 ඉල්ලුම්පත් පැහැදිලි ව හා නිවැරදිව සම්පූර්ණ කළ යුතු වේ. එසේ නොවන ඉල්ලුම්පත් හා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු වේ. :-
විභාග කොමසාරිස් ජනරාල්,
(සංවිධාන හා විදේශ විභාග ශාඛාව),
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

5.5 ඉල්ලුම්පත් ලැබුණු බව දැනුම් දෙනු නොලැබේ.

5.6 ඉල්ලුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ''ඉස්ලාම් ආගමික අහදිය්‍යා අවසාන සහතික පත්‍ර විභාගය - 2014'' යනුවෙන් හා ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතුය.

5.7 ඉල්ලුම්පත්‍ර සමග කිසිදු සහතිකයක් අමුණා එවිය යුතු නැත. අහදිය්‍යා දහම් පාසලේ හෝ මද්රසාවේ විදුහල්පති හෝ පාසලේ විදුහල්පති හෝ ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය නියමිත සුදුසුකම් ලබා ඇති බව සහතික කළ යුතුය.

6. *විභාග ගාස්තු ගෙවන ආකාරය :*

6.1 පළමුවැනි වරට මෙම විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අයකරනු නොලැබේ. පළමුවැනි වරට පසු සම්පූර්ණ විභාගයටම පෙනී සිටින අයදුම්කරුවන් විභාග ගාස්තු වශයෙන් රුපියල් 150 ක් ගෙවිය යුතුය. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා වන විෂයයට රුපියල් 50 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතුය.

6.2 විභාග ගාස්තු ගෙවිය යුතු අයදුම්කරුවන් වෙනුවෙන් ගෙවිය යුතු මුළු මුදලට සමාන ගාස්තුව දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුය. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

7. *ප්‍රවේශ පත්‍ර :*

විභාග කොමසාරිස් ජනරාල් විසින් අදාළ අහදිය්‍යා විදුහල්පති වෙත හෝ මද්රසා විදුහල්පති වෙත හෝ පාසලේ විදුහල්පති වෙත හෝ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විදුහල්පති විසින් එම ප්‍රවේශ පත්‍ර අයදුම්කරුවන් වෙත ලබාදිය යුතු වේ.

7.1 යම්කිසි විභාග අයදුම්කරුවෙකු විභාගයට පෙනී සිටින පළමුවැනි දිනයේ තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද විභාග මධ්‍යස්ථානය හැර වෙනත් මධ්‍යස්ථානයක විභාගයට පෙනී සිටීමට තැත් කළහොත් අදාළ අයදුම්කරුගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.2 ප්‍රවේශ පත්‍රයේ ඇති ඉල්ලුම්කරුගේ අත්සන අහදිය්‍යා දහම් පාසලේ විදුහල්පති හෝ මද්රසා විදුහල්පති හෝ අරාබි විදුහලේ විදුහල්පති හෝ රජයේ සේවයේ යෙදී සිටින රුපියල් 2,40,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ නිලධාරියකු හෝ මස්ජිද් භාර ඉමාම් යන අයගෙන් කෙනකු හෝ විසින් සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට සතියකටවත් පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අහදිය්‍යා පාසල්වල හෝ මද්රසා පාසල්වල විදුහල්පතිවරු මේ පිළිබඳව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දිය යුතුය. එවැනි සෑම අවස්ථාවක දී ම පහත සඳහන් කරුණු දැනුම් දිය යුතුය :-

(අ) විභාගයේ නම :
(ආ) අහදිය්‍යා පාසල්/කුර්ආන් මද්රාසා/රජයේ පාසලේ නම හා පරිගනක අංකය :
(ඇ) අයදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය :
(ඈ) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කල නගරය :
(ඉ) ඉල්ලුම් පත්‍රය භාරදුන් තැපැල් කාර්යාලය :
(ඊ) ලියාපදිංචි කළ දිනය හා අංකය :

8. *අනන්‍යතාව* : එක් එක් විෂයයට පෙනී සිටින සෑම අවස්ථාවකම විභාග ශාලාධිපතිට පිළිගත හැකි වන පරිදි අපේක්ෂකයින් විසින් තමන්ගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සූදානම්ව පැමිණිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ.

8.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
8.2 වලංගු විදෙස් ගමන් බලපත්‍රය,
8.3 තැපැල් හැඳුනුම්පත.

9. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා සමත් බව සහතික කිරීම* :

9.1 මෙම විභාගය සඳහා නියමිත විෂයයන් ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකු ම එම විෂයයන් හතරෙන් ම සමත් විය යුතුය.

9.2 එක් වතාවක දී අදාළ විෂය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් ඌන සාමාර්ථ්‍යයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී වසර දෙකක් (02) ඇතුළත එම ඌන සාමාර්ථ්‍යය ලැබූ විෂයයට පමණක් නැවත පෙනී සිට, එය සමත් වී, ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කළ යුතුය. (මෙය 2011 වසරට අදාළ විභාගයේ සිට බලපැවැත් වේ.)

9.3 එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු සියයක් (100) හිමි වේ. මෙහි දී ලබාදෙන එක් එක් ශ්‍රේණි සඳහා අදාළ ලකුණු පරාස පහත පරිදි වේ. :—

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

9.4 *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම* :

විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර අදාළ ආයතන ප්‍රධානීන් වෙත තැපැල් මගින් දන්වා යවනු ලැබේ.

10. *සහතික පත්‍ර :*

විභාගයෙන් සාමාර්ථ්‍යය ලබන සියලුම අයදුම්කරුවන්ට සහතික පත්‍ර නිකුත් කරනු ලැබේ.

11. *ප්‍රතිඵල නැවත සමීක්ෂණය :*

විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයක් මගින්, නියමිත ගාස්තු ගෙවා අදාළ ආයතනයේ විදුහල්පති මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. විභාග ප්‍රතිඵලවල වෙනසක් සිදුවුවහොත් පමණක් ගාස්තු ආපසු ගෙවනු ලැබේ. කවර හෝ හේතුවක් මත ඉල්ලුම්කරුට හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයකුට හෝ උත්තර පත්‍ර නිරීක්ෂණයට අවසර දෙනු නොලැබේ.

12. ඉහත සඳහන් කොන්දේසි හා උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට සියලු ම අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි සඳහන් නොවූ කරුණු සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණ ගනු ලැබේ.

මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවන් පවතී නම් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කල යුතුය.

ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර,
විභාග කොමසාරිස් ජනරාල්.

2014 ක් වූ අගෝස්තු මස 01 වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

ඇමුණුම - 01

*විභාගය සඳහා වූ විෂයයන් හා විෂය නිර්දේශය*

මෙම විභාගයට අයත් එක් එක් ප්‍රශ්න පත්‍රයක් පැය තුනක කාලයක් සඳහා සකස් කර ඇති අතර, එවැනි ප්‍රශ්න පත්‍ර හතරක් විභාගයට අයත් වේ. ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ ප්‍රශ්නයන්ට ලකුණු වෙන් කරන ආකාරය අංක 1358 හා 2004.09.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයේ සඳහන් පරිදිම සිදු කෙරේ.

*පළමුවැනි ප්‍රශ්න පත්‍රය :*

1. අකීදා සහ ෂරීආ (ඉස්ලාම් සිද්ධාන්ත හා මූලිකාංග) සහ ආරාබි භාෂාව :

1.1 අකීදා පොදු පැහැදිලි කිරීම් (අල් ඉලාහියයාත්, අන්නුබුව්වත්, අර්රූහානියත්, අස්සම් ඉය්යාත්)

1.2 අකීදාවේ කොටස් :
+ අහුලුස්සුන්නා වල්ජමා අත්හි අකීදා
+ අනිකුත් අකීදා කොටස් කිහිපයක් : ජබරිය්යා, කදිරිය්යා, මුර්ජියා, මුඃතසිලා, ෂියා

1.3 තෞහිද් හා ෂිර්ක්කු :
+ ඊමාන් හා කුෆ්රු
+ රිද්දත්, නිෆාක්
+ අල්කුර්ආණය පහළ කර එය සම්පාදනය කරන ලද ආකාරය පිළිබඳ ඉතිහාසය
+ නීති මූලධර්මයන් වශයෙන් අල්කුරාණයේ උපයෝජනය
+ සුන්නාවේ බිහිවීම හා එය සම්පාදනය කළ ඉතිහාසය
+ නෛතික මූලධර්ම වශයෙන් සුන්නාවේ උපයෝජනය
+ හදීස් කලා ඉතිහාසය හා ප්‍රධාන මුහද්දීස්වරුන්ගේ දායකත්වය
+ ඉජ්තිහාද් පිළිබඳ විස්තර
+ ආධාරක මූලධර්මයන් වශයෙන් ඉජ්මා
+ ආධාරක මූලධර්මයන් වශයෙන් කියාස්
+ ෆික්හයේ ඉතිහාසය හා ප්‍රධාන ඉමාම්වරු

1.4 අරාබි භාෂාව :
+ හැඩහුරු සහිතව ලිවීම
+ කුඩා වාක්‍යයන් ලිවීම
+ ඉස්ලාම් විෂයයට අදාළ අරාබි වචන ලිවීම
+ ප්‍රධාන සූරා, ආයත්, හදීස් ආදිය නිවැරදිව ලිවීම

*දෙවැනි ප්‍රශ්න පත්‍රය :*

2. අල්ෆික්හුල් ඉස්ලාම් (ඉස්ලාමීය නීති පද්ධතිය)

2.1 ඉබාදත් පිළිබඳ විස්තර :
+ ඉබාදතයේ කොටස්
+ තහාරත්

2.2 නජීසය හා එහි කොටස් :
+ නජීසය පිරිසිදු කිරීමේ ක්‍රම
+ ජලය හා එහි වර්ග
+ වුදු, තයම්මුම්, ස්නානය පිළිබඳ පවතින ක්‍රියාදාමයන්

2.3 සකාත් :
+ වැදගත්කම
+ විධි හා ක්‍රම
+ එක්රැස් කිරීම හා බෙදා හැරීම
+ සකාත් මගින් දිළිඳුකම තුරන් කිරීම සහ සම්පත් බෙදීම

2.4 නෝම්බිය (උපවාසය) :
+ වැදගත්කම
+ විධි ක්‍රම හා ප්‍රයෝජනය

2.5 හජ් :
+ වැදගත්කම
+ විධි ක්‍රම හා ප්‍රයෝජන

2.6 හජ් ඉටු කරන ක්‍රමය :
+ පරලු වාජිබ් සුන්නත්
+ පරලු හජ් යට අමතරව ඉටුකරන හජ්

2.7 ඉස්ලාම්හි ආහාර, ඇඳුම්, වාසස්ථාන පිළිබඳ අවධානය හා ක්‍රියාදාමයන්

2.8 ජිහාත් පිළිබඳ පැහැදිලි කිරීම

2.9 කුර්බානි හා කැපුම් ක්‍රමයන්

2.10 දිව්රුම හා භාරවීම

2.11 මුආමලාත් පිළිබඳ විස්තර :
+ ඉපයීමේ වැදගත්කම
+ ප්‍රධාන ගණුදෙනු (වෙළඳාම)
+ අනිකුත් ගණුදෙනු (උදා. : තාවකාලිකව ඉල්ලා ගැනීම, බදු ගැනීම)
+ වක්ෆු, වසීය්යත්, වරාසත්, (පොදු දේපළ, බූදල් දේපළ, පරම්පරා දේපළ)

2.12 ඉස්ලාම්හි ස්ත්‍රී පුරුෂ තත්ත්වයන් :
+ නිකාහයේ විධි හා ප්‍රයෝජන
+ පවුල් ජීවිතය
+ අඹුසැමියන්

+ දෙමාපිය, දූදරු අයිතිවාසිකම් හා යුතුකම්
+ තලාක් හා ඉද්දා

2.13 ජිනායත් :
+ හුදූද්, කියාස්, තඃසීර්

තුන්වන ප්‍රශ්න පත්‍රය :

3. සීරා හා තාරිකු :

3.1 ඉස්ලාමයට පෙර වූ අරාබි රටේ සමාජ ආගමික තත්ත්වයන්

3.1.1 නබි(සල්) තුමා
+ නුබුව්වතයට පෙර ජීවිතය
+ පවුල, පරම්පරාව
+ තරුණ විය
+ උතුම් ගුණාංග
+ විවාහය

+ නුබුව්වත් හා හිජ්රත් අතර ජීවිතය
  + නුබුව්වත් ලැබීම
  + ඉස්ලාමික ප්‍රචාරයන් හා එහි ප්‍රතිඵල
  + මිඃරාජ්
  + හිජ්රත්

+ මදීනා ජීවිතය
  + සමාජ දේශපාලන ක්‍රියාකාරකම්
  + ආත්මාරක්ෂා යුද්ධයන් හා සාම ගිවිසුම්
  + ඉස්ලාම් සම්පූර්ණවීම
  + සහාබාවරුන්ගේ තත්ත්වයන් හා ඉස්ලාමය වෙනුවෙන් එතුමන්ලාගේ දායකත්වයන්
  + කුලපාඋර්රා සීදුන් යන අයගේ ඉතිහාසය හා දේශපාලන දායකත්වයන්
  + උමය්යා අබ්බාසිය්යා පාලනකාලය
  + බයිතුල් මුකද්දසයේ ඉතිහාසය
  + ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා දායකත්වය
  + විද්‍යාත්මක දැනුමට මුස්ලිම්වරුන්ගේ දායකත්වය
  + පහත සඳහන් අය පිළිබඳ ඉතිහාසය :-
    * ඉමාම් බුහාරි (රහ්)
    * ඉමාම් ෂාපිර් (රහ්)
    * ඉමාම් ගස්සාලි (රහ්)
    * ඉමාම් අබ්දුල් කාදර් ජීලාන් (රහ්)
    * ඉමාම් ෂාදුලි (රහ්)

හතරවන ප්‍රශ්න පත්‍රය :

4. අක්ලාක් - (ඉස්ලාම් සාරධර්මය)

4.1 අක්ලාක් පිළිබඳ ඉස්ලාමයේ අවධානය :
+ අක්ලාක් පිළිබඳ විස්තර
+ ඊමාන් සහ අක්ලාක් අතර පවතින සම්බන්ධතාවය
+ අක්ලාක් හා ඉබාදත් අතර තිබෙන සම්බන්ධතාවය
+ හෘද පවිත්‍රත්වය (ඉක්ලාස්)

4.2 තක්වා :
+ වරුඋසුහ්ද්
+ මුරාකබා, මුහාසබා
+ ෂවුක් (දේවකරුණාව)

4.3 දන්දීම :
+ කැපවීම
+ කෘතඥභාවය
+ ඉවසීම, හික්මීම, ඉඩදීම, සමාවීම
+ බැගෑපත්වීම
+ කාලය අගය කිරීම
+ අවයවයන් රැකගැනීම කට, ඇස, කණ, ලිංගික අංගයන්
+ අන් අයට ගෞරව කිරීම
+ යුක්තිය හා අවංකභාවය
+ තරුණ තරුණියන් අතර දක්නට ලැබිය යුතු වැදගත් සදාචාර ගුණාංගයන්
+ අනිකුත් ආගමික අය අතර වූ සහජීවනය

4.4 ඉස්ලාම් නීති පද්ධතිය :

ඇමුණුම 02

*අදාළ දිස්ත්‍රික්කවල විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට බලාපොරොත්තුවන නගර හා නගර අංක*

| *නගරය* | *නගර අංකය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය : | | 01 |
| මැද කොළඹ | 01 | |
| බම්බලපිටිය | 02 | |
| ගම්පහ දිස්ත්‍රික්කය : | | 02 |
| තිහාරිය | 03 | |
| මාබෝල | 04 | |
| මල්වාන | 05 | |
| මීගමුව | 06 | |
| කල්එළිය | 07 | |
| කළුතර දිස්ත්‍රික්කය : | | 03 |
| පානදුර | 08 | |
| කළුතර | 09 | |
| අලුත්ගම | 10 | |
| ගාල්ල දිස්ත්‍රික්කය : | | 04 |
| ගාල්ල | 11 | |
| මාතර දිස්ත්‍රික්කය : | | 05 |
| වැලිගම | 12 | |
| මාතර | 13 | |
| හම්බන්තොට දිස්ත්‍රික්කය : | | 06 |
| හම්බන්තොට | 14 | |

| නගරය | නගර අංකය | දිස්ත්‍රික් අංකය |
|---|---|---|
| කෑගල්ල දිස්ත්‍රික්කය : | | 07 |
| මාවනැල්ල | 15 | |
| වරකාපොල | 16 | |
| කන්නත්තොට | 17 | |
| කුරුණෑගල දිස්ත්‍රික්කය : | | 08 |
| කුලියාපිටිය | 18 | |
| කුරුණෑගල | 19 | |
| මැල්සිරිපුර | 20 | |
| පොල්ගහවෙල | 21 | |
| කැකුණගොල්ල | 22 | |
| පුත්තලම දිස්ත්‍රික්කය : | | 09 |
| නොරොච්චෝලෙයි | 23 | |
| පුත්තලම | 24 | |
| හලාවත | 25 | |
| අනුරාධපුර දිස්ත්‍රික්කය : | | 10 |
| අනුරාධපුර | 26 | |
| කැකිරාව | 27 | |
| ගලෙන්බිඳුණුවැව | 28 | |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය : | | 11 |
| කදුරුවෙල | 29 | |
| මාතලේ දිස්ත්‍රික්කය : | | 12 |
| මාතලේ | 30 | |
| මහනුවර දිස්ත්‍රික්කය : | | 13 |
| මහනුවර | 31 | |
| නාවලපිටිය | 32 | |
| දෙල්තොට | 33 | |
| ගෙලිඔය | 34 | |
| නුවරඑළිය දිස්ත්‍රික්කය : | | 14 |
| නුවරඑළිය | 35 | |
| රත්නපුර දිස්ත්‍රික්කය : | | 15 |
| ඇහැලියගොඩ | 36 | |
| බලංගොඩ | 37 | |

| නගරය | නගර අංකය | දිස්ත්‍රික් අංකය |
|---|---|---|
| බදුල්ල දිස්ත්‍රික්කය : | | 16 |
| බදුල්ල | 38 | |
| වැලිමඩ | 39 | |
| මොණරාගල දිස්ත්‍රික්කය : | | 17 |
| බිබිල | 40 | |
| අම්පාර දිස්ත්‍රික්කය : | | 18 |
| අක්කරෙයිපත්තුව | 41 | |
| පොතුවිල් | 42 | |
| කල්මුනේ | 43 | |
| සමන්තුරේ | 44 | |
| ඉරක්කාමම් | 45 | |
| නින්දවූර් | 46 | |
| ඔලුවිල් | 47 | |
| මඩකලපුව දිස්ත්‍රික්කය : | | 19 |
| කාත්තාන්කුඩි | 48 | |
| එරාවූර් | 49 | |
| වාලච්චේන | 50 | |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය : | | 20 |
| මුතූර් | 51 | |
| කින්නියා | 52 | |
| ත්‍රිකුණාමලය | 53 | |
| වවුනියාව දිස්ත්‍රික්කය : | | 21 |
| වවුනියාව | 54 | |
| මන්නාරම දිස්ත්‍රික්කය : | | 22 |
| මන්නාරම | 55 | |
| මුලතිවු දිස්ත්‍රික්කය : | | 23 |
| මුලතිවු | 56 | |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය : | | 24 |
| කිලිනොච්චි | 57 | |
| යාපනය දිස්ත්‍රික්කය : | | 25 |
| යාපනය | 58 | |

08-647

## විගණකාධිපති දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරීවරුන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2014

ශ්‍රී ලංකා විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරීවරුන් බඳවා ගැනීම සඳහා පහත 02 හි සඳහන් සුදුසුකම් ලත් අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන විවෘත තරඟ විභාගය 2014 නොවැම්බර් මාසයේ දී විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමවේදය* :-

ශ්‍රී ලංකා විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 20% කට නොවැඩි සංඛ්‍යාවක් වූ පුරප්පාඩු වන 15 ක ප්‍රමාණයක් පහත 02 හි සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් ලිඛිත පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එහි ප්‍රතිඵල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පුරවනු ලැබේ.

02. *සුදුසුකම්* :-

සෑම අපේක්ෂකයෙකුම,

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය ;

(*ආ*) පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතු ය.

(1) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය විෂයයක් සහිතව උපාධිය;

(2) වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය;

(3) සාමායක ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය;

(4) රාජ්‍ය මුල්‍ය සහ බදු හෝ ඊට සමාන ක්ෂේත්‍රයක විද්‍යාවේදී උපාධිය.

(5) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අන්තර්මාධ්‍ය සහතිකය හෝ ආවසරික සහතිකය ලබාගෙන තිබීම හෝ පහත සඳහන් වෘත්තීය ගණකාධිකාරී ආයතනයකින් ඒ හා සමාන මට්ටමක සුදුසුකම් ලබා තිබීම.

(i) එංගලන්තයේ සහ වේල්ස් හි වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය,

(ii) එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය,

(iii) එක්සත් රාජධානියේ සහතිකලත් වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය හෝ ඊට සමාන වෘත්තීය ආයතනයක්.

(6) එක්සත් රාජධානියේ පිරිවැය සහ කාර්මික ගණකාධිකාරීන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය.

(7) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් ජාතික ගණකාධිකරණය ඩිප්ලෝමාව.

(8) ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ ඩිප්ලෝමාව.

(9) මාසිකව රු. 13,640 කට නොඅඩු ආරම්භක වැටුපක් හිමි දෙපාර්තමේන්තු ශ්‍රේණියක හෝ ඒකාබද්ධ සේවයක තනතුරක් දරන්නාවූ ද, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට රජයේ/පළාත් රාජ්‍ය සේවයේ අවුරුදු 10 ක අඛණ්ඩ සේවයක් ඇත්තා වූ ද, සේවයේ ස්ථිර කර ඇති නිලධාරියෙක්.

(10) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 5 ක සේවාවක් සහිත රජයේ/පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවසායක සිය පත්වීම ස්ථිරකර ඇති පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් දරන නිලධාරියෙක්.

(11) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 5 ක සේවාවක් සහිත රජයේ/පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවසායක සිය පත්වීම ස්ථිරකර ඇති උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා මධ්‍ය පරීක්ෂණයෙන් සමත්වී ඇති නිලධාරියෙක්.

(12) මාසිකව, රු. 14,980 කට නොඅඩු ආරම්භක වැටුපක් ඇති රාජ්‍ය ව්‍යවසායක තනතුරක් දරන්නා වූද, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 10ක අඛණ්ඩ සේවාවක් ඇත්තා වූ ද, සේවයේ ස්ථිරකර ඇති නිලධාරියෙක්.

*සටහන්* :

(i) සාමාර්ථය ලැබීම පිණිස අවශ්‍යවන විභාගය හෝ විභාග 2014 සැප්තැම්බර් 12 වැනි දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ii) සුදුසුකම් පිළිබඳ නිල සහතිකය හෝ එම සහතිකය වෙනුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිගන්නා නිළ ලේඛනයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

03. *වැටුප් පරිමාණය* :-

මෙම තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුප් ක්‍රමය එස්එල් - 1, රු. 22,935- 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555 ක් වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව වැටුප් ගෙවනු ලැබේ.

04. *වයස් සීමාව* :-

2014 සැප්තැම්බර් මස 12 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අය සම්බන්ධයෙන් මෙම වයස් සීමාව බලපානු නොලැබේ.

05. *කායික යෝග්‍යතාව හා අනෙකුත් සේවා කොන්දේසි* :-

(*අ*) සෑම අයදුම්කරුවකුම යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය;

(*ආ*) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය;

(*ඇ*) මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව සේවයට බැඳී අදාළ පරිදි දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය;

(*ඈ*) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් වන අතර, අවුරුදු තුනක පරිවාස කාලයකට/එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

06. *විභාග ක්‍රමය :-*

(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ;

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් විභාගයෙන් සාමාර්ථය ලබා ගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන්ය;

(ඇ) අපේක්ෂකයෙකු සුදුසුකම් ලත් විභාගයේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත්ව ඇත්නම්, එම විභාගයේ දී ඔහු සමත්වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට යොදාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතුය;

(ඈ) ප්‍රධාන විෂයය එක් භාෂාවකිනුත්, අතිරේක විෂයය තවත් භාෂාවකිනුත්, සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයෙකු ප්‍රධාන විෂයයන් සාමාර්ථය ලබා ගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

*සටහන :-*

(i) ඉහත (අ) සහ (ඇ) හි සඳහන් "සුදුසුකම් ලත් විභාගය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ 02 වැනි ඡේදයේ දක්වා ඇති විභාගවලින් එකක් ය,
(ii) අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය,
(iii) තම අයදුම් පත්‍රයේ සඳහන් මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයන්ට ඉඩ දෙනු නොලැබේ.

07. *ලිඛිත පරීක්ෂණයේ දී විෂය නිර්දේශය :-*

පහත සඳහන් විෂයයන් හය සඳහා පැය තුන බැගින් වූ ලිඛිත ප්‍රශ්න පත්‍ර හයකින් සමන්විත වන අතර, එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා මුළු ලකුණු 100 ක් බැගින් වේ.

(i) ගණකාධිකරණය,
(ii) විගණනය,
(iii) ව්‍යාපාර ගණිතය,
(iv) පිරිවැය ගණකාධිකරණය,
(v) ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය මූල්‍ය,
(vi) සාමාන්‍ය වාණිජ දැනුම සහ වාණිජ අංක ගණිතය,
*හෝ*
(vii) ආණ්ඩුවේ මුදල් රෙගුලාසි සහ මුදල් කාර්ය පරිපාටිය.

ඉහත (i) සහ (v) දක්වා ප්‍රශ්න පත්‍රවලට අමතරව, මෙම නිවේදනයේ 02 (ආ) හි (1) සිට (8) දක්වා වූ ඡේදයන් යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයන් විසින් (vi) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය යුතු අතර, 02(ආ) හි (9) සිට (12) දක්වා වූ ඡේදයන් යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයන් විසින් (vii) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය යුතු වේ.

*විෂය නිර්දේශය* :

(i) ගණකාධිකරණය : පහත සඳහන් මාතෘකා ආශ්‍රිත පැය 3 ක එක් ප්‍රශ්න පත්‍රයකි,
(ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.)

ගණකාධිකරණ න්‍යාය, නිෂ්පාදන ගිණුම්, වෙළඳ ගිණුම්, ලාභාලාභ ගිණුම් හා ශේෂ පත්‍රය, අවිනිශ්චිත ගිණුම් සහ වැරදි නිවැරදි කිරීම්, තනි සටහන් ක්‍රමය සහ අසම්පූර්ණ වාර්තා, එකතු ගිණුම්, තොග ඇගයුම්, ලැබීම් හා ගෙවීම් ගිණුම්, ආදායම් හා වියදම් ගිණුම් මුදල් පදනම හා උපචිත පදනම, ප්‍රාග්ධන හා අයභාර වියදම, ක්ෂය, ක්‍රමක්ෂය හා හායනය, හවුල් ව්‍යාපාර ගිණුම්, ප්‍රතිපාදන සහ සංචිත, බද්ධ ව්‍යාපාර, විනිමය බිල්පත්, සීමිත සමාගම්, රාජ්‍ය සංස්ථා ගිණුම්, නියෝජන ගිණුම්, විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත බඩු යැවීම, හිස් බඳුන් ගිණුම්, ශාඛා ගිණුම්, වෙළඳාංශ ගිණුම්, කුලී පිට ගැණුම් ගිණුම, ආයෝජන ගිණුම් සහ පුරස්කාර ගිණුම්.

(ii) විගණනය : පහත සඳහන් මාතෘකා ආශ්‍රිත පැය 3 ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.)

*විගණනය පිළිබඳ පොදු සිද්ධාන්ත සහ මූලධර්ම :*

විගණන වර්ගීකරණය - අභ්‍යන්තර සහ බාහිර, ව්‍යවස්ථාපිත සහ පෞද්ගලික, ශේෂ පත්‍ර විගණනය, අතුරු හා අවසාන විගණනය, රාජ්‍ය විගණනය සහ පෞද්ගලික ව්‍යාපාර විගණනය.

බාහිර විගණකවරයාගේ සහ අභ්‍යන්තර විගණකවරයාගේ කාර්ය කාර්යය, ඔවුන්ගේ සම්බන්ධතාව, පෞද්ගලික ගුණාංග, ස්වාධීනත්වය.

අභ්‍යන්තර පාලනය සහ පරීක්ෂාව .- අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය, සටහන් තැබීම, ප්‍රාරම්භක ඇගැයුම්, තහවුරු කිරීම හා අවසාන ඇගැයුම්, විශ්ලේෂණ විගණනය, සංවිධාන සටහන් හා ප්‍රවාහ සටහන් ගැඹුරින් විගණනය.

සන්නිරීක්ෂණය - ප්‍රාග්ධන හා අයභාර වියදම් හා ආදායම් හා වියදම් වර්ග කිරීම, නියැදි ක්‍රම සහ ශිල්ප ක්‍රම වංචා සහ වැරදි සොයා ගැනීම සහ වැළැක්වීම.

විකුණුම් විගණනය - ණයගැති සහ ලැබීම් කාර්ය පරිපාටිය, ණයට ගැනුම් සහ ගෙවීම් කාර්ය පරිපාටිය, පඩි ලැයිස්තු, කාර්ය පරිපාටිය, පිරිවැය සහ ඉන්වෙන්ට්‍රි වාර්තා, ගිණුම් පොත්, අතුරු හා අවසාන ගිණුම්

වත්කම් හා බැරකම් සත්‍යාපනය - ස්ථාවර වත්කම්, ආයෝජන, තොග, ණය ගැතියෝ, මුදල් බැරකම්, අසම්භාව්‍ය බැරකම් යන මේවා පිළිබඳ අයිතිය, පැවැත්ම හා ඇගැයුම.

සීමිති සමාගම් - සීමිත සමාගම්වල ව්‍යවස්ථාපිත පොත්, අධ්‍යක්ෂවරුන්ගේ බලතල සහ කාර්යයන්, බෙදිය හැකි ලාභ.

රාජ්‍ය සංස්ථා - විගණකයින් පත් කිරීම, ගාස්තු සහ ඉවත් කිරීම, අළුත් විගණනයක් පිළිගැනීමට පෙර ගත යුතු ක්‍රියාමාර්ගය.

*විගණකගේ බලතල, කාර්යයන් සහ වගකීම :*

අභ්‍යන්තර හා බාහිර විගණන සංවිධානය කිරීම සහ පාලනය, විගණන වැඩසටහන්, අභ්‍යන්තර පාලන ප්‍රශ්න මාලා සහ සිතියම් සටහන්.

*යාන්ත්‍රික ගිණුම්කරණ පද්ධති විගණනය :*

අභ්‍යන්තර විගණනය, කාර්යක්ෂමතා විගණනය, කළමනාකරණ විගණනය, මෙහෙයුම් විගණනය, පද්ධති විගණනය, මුදලට අගය විගණනය

විමර්ශනය

(iii) ව්‍යාපාර ගණිතය : පහත සඳහන් මාතෘකා ආශ්‍රිත පැය 3 ක එක් ප්‍රශ්න පත්‍රයකි.

(ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.)

ශ්‍රේණි - සමාන්තර ශ්‍රේණි, ගුණෝත්තර ශ්‍රේණි, ද්විපද සහ සාතිය, ශ්‍රේණි, වැල් පොළිය සහ වට්ටම් පිළිබඳ සූත්‍ර සහ ඒවා ලබා ගන්නා අන්දම.

සමීකරණ - ඒකජ සමීකරණ සහ වර්ගජ සමීකරණ හා ඒවායේ ප්‍රස්තාරික සමක, එම සමීකරණ ලබා ගැනීම සහ උපරිම හා අවම ලක්ෂ්‍ය විසඳීම් සඳහා ඒවා යොදා ගැනීම.

දත්ත - දත්ත එක් රැස් කිරීම සහ වර්ග කිරීම, සන්නිරීක්ෂණය සහ නිරවද්‍යතාවයේ සීමා, වෙළඳපොළ පර්යේෂණ සහ දත්ත එක් රැස් කිරීම.

ඉදිරිපත් කිරීම - වාර්තා සකස් කිරීමේදී සංඛ්‍යාලේඛන භාවිත කිරීම, සංඛ්‍යාන තොරතුරු විශ්ලේෂණය කිරීම සහ ශිල්පීය නොවන භාෂාවෙන් ඒවා තේරුම් කර දීම, ලඝුගණක ප්‍රස්තාර ඇතුළු ප්‍රස්තාර සහ රේඛා චිත්‍ර.

(iv) පිරිවැය ගණකාධිකරණය : පහත සඳහන් මාතෘකා ආශ්‍රිත පැය 3 ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.)

*ද්‍රව්‍ය :*

මිලට ගැනීම - ද්‍රව්‍ය පිරිවිතර, ද්‍රව්‍ය ඉල්ලුම් කිරීමේ, ඇණවුම් කිරීමේ සහ පසුවිපරම් කිරීමේ කාර්ය පරිපාටි.

භාණ්ඩ භාර ගැනීම - භාණ්ඩ ලැබීම්, ඒවායේ ප්‍රමාණය, තත්ත්වය සහ පිරිවිතර පරීක්ෂා කිරීමේ ක්‍රම.

ද්‍රව්‍ය වර්ගීකරණය - අමුද්‍රව්‍ය, කෙරීගෙන යන වැඩ, නිමි බඩු, ඇසුරුම් ද්‍රව්‍ය, නඩත්තු ද්‍රව්‍ය, මෝස්තර හා මෙවලම් සහ අනියමිත ද්‍රව්‍ය වර්ග කිරීම සහ සංකේතනය කිරීම.

ගබඩා - සැලැස්ම, ගබඩා කිරීමේ ක්‍රම, අමුද්‍රව්‍ය, කෙරීගෙන යන වැඩ සහ නිමි බඩු සහ ඇසුරුම් ද්‍රව්‍ය සඳහා ගබඩා, මෙවලම්, මෝස්තර, නඩත්තු ද්‍රව්‍ය සහ වෙනත් අනියමිත ද්‍රව්‍ය සඳහා ගබඩා, මධ්‍යගත හා විමධ්‍යගත ගබඩා සහ උප ගබඩා, අභ්‍යන්තර ප්‍රවාහනය සහ ද්‍රව්‍ය පැටවීමේ සහ බෑමේ යාන්ත්‍රික උපකරණ.

ගබඩා තබා ගැනීම - ලැබීම්, නිකුත් කිරීම්, තොග ගබඩාවෙන් මාරු කිරීම් සහ ගබඩාවට ආපසු එවන බඩු, ඇණවුම්, වෙන් කිරීම් සහ නිදහස් ශේෂ සටහන් කිරීම, සැපයුම්කරුවන්ට ආපසු යවන බඩු, සුන්බුන් සහ ඉවතලන දේ සම්බන්ධ කටයුතු

තොග පාලනය - උපරිම, අවම සහ නැවත ඇණවුම් කිරීමේ මට්ටම්, ඇණවුම් ප්‍රමාණ, නරක්වෙන බඩු පාලනය කිරීම, නාස්තිය වැළැක්වීම, වැඩිපුර ප්‍රයෝජනයට නොගන්නා තොග, අක්‍රිය තොග සහ අභාවිත තොග පිළිබඳ සමාලෝචනය

තොග ගණන් ගැනීම - තොග ගණන් ගැනීම සංවිධානය කිරීම, ආකෘති පත්‍ර සකස් කිරීම, ඉන්වෙන්ට්‍රි වර්තා පාලනය කිරීම, විද්‍යාමාන තොග සටහන් කිරීම, මිල කිරීම, ඉන්වෙන්ට්‍රි වාර්තා විස්තාවරණය කිරීම සහ සම්පිණ්ඩනය කිරීම, නිත්‍ය ඉන්වෙන්ට්‍රි සහ අඛණ්ඩ තොග ගණන් ගැනීමේ විෂමතාවයන්, විමර්ශනය කිරීම සහ ඒ සම්බන්ධ කටයුතු කිරීම.

ද්‍රව්‍ය පිරිවැයකරණය - ද්‍රව්‍ය මිල කිරීමේ ක්‍රම සහ පිරිවැය ගණන් බැලීම, පිරිවැය මධ්‍යස්ථානවලට සහ ඒකකවලට වෙන් කිරීම, ද්‍රව්‍ය සම්පිණ්ඩන වාර්තා, තොග ලෙජර

ද්‍රව්‍ය පිරිවැය - නිමැවුම් ඒකකයක පිරිවැය, පළුදු ද්‍රව්‍යවල පිරිවැය.

*ශ්‍රමය :*

වැඩ වාර්තා - කාලය සහ නිමැවුම් ප්‍රමාණය සටහන් කිරීම සහ සටහන් වර්ග, පළුදු වූ වැඩ, අපතේ ගිය කාලය.

පඩිනඩි - පඩිනඩි ගෙවීමේ ක්‍රම, පෙළඹවීම සඳහා ගෙවීම් සහ ප්‍රතිඵල අනුව ගෙවීම, වැඩ අධ්‍යයන, සම්මත ගාස්තු ප්‍රමාණය නියම කිරීම

වැඩ ඇගයුම් - කුසලතා ප්‍රමාණය කිරීම, පළුදු වූ වැඩ සඳහා ඉඩ හැරීම.

*අතිරේක දීමනා :*

පඩි ලැයිස්තු කාර්ය පරිපාටි - දළ ඉපැයුම් ගණන් බැලීම සහ සත්‍යාපනය කිරීම, ස්වේච්ඡා සහ ව්‍යවස්ථාපිත අඩු කිරීම්, පඩි ලැයිස්තු ක්‍රම සහ ඒ සම්බන්ධ සිරිත් ප්‍රකාර වැඩ, ගෙවීමේ කාර්ය පරිපාටි, පඩි ලැයිස්තු, සම්පිණ්ඩන වාර්තා.

ශ්‍රම පිරිවැයකරණය - පිරිවැය මධ්‍යස්ථානවලට හා පිරිවැය ඒකකවලට වර්ග කිරීම, වෙන් කිරීම හා විභාජනය කිරීම, පිරිවැය ප්‍රමාණයෙන් ගණන් බැලීම

ශ්‍රම පිරිවැය පාලනය කිරීම - නිමැවුම් ඒකක, ඍජු ශ්‍රම කාර්යක්ෂමතා, මිනුම්, ප්‍රසාද දීමනා, ඉපැයුම් මට්ටම්, අතිකාල සහ අපතේ යන කාලය, ඍජු ශ්‍රමය හා වක්‍ර ශ්‍රමය අතර අනුපාතය, පළුදු වැඩවල පිරිවැය.

පොදු කාර්ය :

සාමාන්‍ය - පොදු කාර්ය ස්වභාවය සහ වර්ග, පර්යේෂණ කටයුතු, සංවර්ධන සැලසුම් කිරීම, මිලට ගැනීම්, නිෂ්පාදනය, කාර්ය මණ්ඩල, විකිණීම, බෙදා හැරීම, පරිපාලනය හා මූල්‍යකරණය සම්බන්ධ පොදු කාර්ය පිරිවැය, ස්ථාවර අර්ධ විචල්‍ය පොදු කාර්ය පිරිවැය.

එක්රැස් කිරීම - වර්ග කිරීම සහ සංකේතනය කිරීම, විවිධ කරුණු ගැන කටයුතු කිරීමේ දී පවත්නා තත්ත්වය බලාපන ආකාරය, මුල් සටහන පිළිබඳ වාර්තා, පොදු කාර්ය වියදම් ගණන් තැබීමේ සටහන් හා සම්පිණ්ඩන වාර්තා.

වෙන් කිරීම් හා විභාජනය - පිරිවැය මධ්‍යස්ථානවලට හා පිරිවැය ඒකකවලට වෙන් කිරීම් හා විභාජනය කිරීම.

අන්තර්ග්‍රහණය - පිරිවැය ඒකකයට පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රම, නිමැවුම් මට්ටම්, පොදු කාර්ය වියදම් අන්තර්ග්‍රහණය කෙරෙහි බලපාන ආකාරය, ඌණ අන්තර්ග්‍රහණය හා අධි අන්තර්ග්‍රහණය, ඊට හේතු හා ඒ සම්බන්ධ කටයුතු කළ යුතු ආකාරය.

සේවා - නඩත්තු කිරීම ඇතුළු සේවාවන්, පාවිච්චිය මැනීම, පිරිවැය සටහන් කිරීම සහ පිරිවැය ඒකකවලට අයකිරීම, ඒ සඳහා උපයෝගීකරණය

පිරියත් හා යන්ත්‍ර සූත්‍ර - පිරියත් සහ යන්ත්‍ර සූත්‍ර සම්බන්ධ වාර්තා, ක්ෂයවීම්, ඒවා පාවිච්චිය සහ ඒවායේ කාර්යක්ෂමතාවය.

*පිරිවැය ශිල්ප ක්‍රම ඃ*

පිරිවැය ප්‍රභේද - (සමූහ හා කොන්ත්‍රාත්තු ඇතුළුව) කාර්යය අනුව පිරිවැයකරණය ක්‍රම සහ කාර්ය පරිපාටි සහ නිෂ්පාදිත පිරිවැය සකස් කිරීම, (නිෂ්පාදිත පිරිවැය මෙහෙයවීම හා සකස් කිරීම ඇතුළුව) පිරිසැකසුම් පිරිවැයකරණ ක්‍රම සහ කාර්ය පරිපාටි.

බද්ධ නිෂ්පාදන හා අතුරු නිෂ්පාදන - බද්ධ සහ අතුරු නිෂ්පාදන අතර වෙනස සහ ඒ හා සම්බන්ධ ගණන් තබන ආකාරය, සටහන් තැබීමේ වෛකල්පිත ක්‍රම, විභාජනය සම්බන්ධ වෛකල්පිත පදනම්, පිරිවැය හා භාවිතා කළ අගය එක්රැස් කිරීම, සීමාවන් හා ප්‍රායෝගිකත්වය.

නාස්තිය - නාස්තිය, නරක්වීම, පළුදු වූ වැඩ, දෝෂ පරිශෝධනය, නිෂ්කාර්ය කාලය සහ නිෂ්කාර්ය පහසුකම් පිරිවැය.

කාර්යයෝ ඃ පර්යේෂණ, සංවර්ධන, සැලසුම් කිරීම සහ පූර්ව නිෂ්පාදන, මිලට ගැනීම, කාර්ය මණ්ඩලය, නිෂ්පාදනය, අලෙවි කිරීම, පරිපාලනය සහ මූල්‍ය පිරිවැය.

*අයවැය පාලනය සහ සම්මත පිරිවැය ඃ*

අයවැය ලේඛනය සහ ප්‍රමිත - ප්‍රධාන අයවැය ලේඛනය සහ උපයෝගී අයවැය ලේඛනය, අයවැය ලේඛන අත්පොත, සම්මත පිරිවැය ප්‍රමාණ, ස්ථාවර සහ නම්‍ය අයවැය ලේඛන, සම්මත නිෂ්පාදිත පිරිවැය.

එක්රැස් කිරීම හා විශ්ලේෂණය - ප්‍රමිත සහ අයවැය ලේඛනය සමග සංසන්දනය කිරීම සඳහා තථ්‍ය වියදම් හා නිමැවුම්.

විචල්‍යතා විශ්ලේෂණය - සියලුම පිරිවැය මූලිකාංගයන්හි අතරමැදි මට්ටම්වලදී මුළු විචල්‍යතාවය විශ්ලේෂණය කිරීම.

*ආන්තික පිරිවැයකරණය ඃ*

ආන්තික පිරිවැය සකස් කිරීමේ ශිල්ප ක්‍රම සහ අතරමැදි මට්ටමේදී ආන්තික පිරිවැය සකස් කිරීම.

*ඉදිරිපත් කිරීම සහ භාවිතය ඃ*

පෙරසැරි හා වෙළඳාංශ සඳහා මෙහෙයුම් වාර්තා - ඉදිරිපත් කිරීමේ ක්‍රම, වාචික, සංක්ෂිප්ත, වක්‍රගත, ප්‍රස්තාරික සහ වෙනත් දෘෂ්ටි ක්‍රම, අඛණ්ඩ සහ තත්කාර්ය වාර්තා සහ ඒවා ඉදිරිපත් කිරීම.

(v) ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය මූල්‍ය - පහත සඳහන් මාතෘකා ආශ්‍රිත පැය 3 ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.)

අගය පිළිබඳ සිද්ධාන්තය - ඉල්ලුම හා සැපයුම, මිල යාන්ත්‍රණය, පූර්ණ තරඟය සහ අපූර්ණ තරඟය, ඒකාධිකාරය, ආර්ථික බදු කුලිය, ශ්‍රමය හා වැටුප් පරිමාණය, ප්‍රාග්ධනය හා පොලී ප්‍රමාණ, පෙල ගැසීම විවරණය, සමතුලිතතා සිද්ධාන්තය, සමාජ පිරිවැය සහ මිල ක්‍රමයට බාහිර ප්‍රතිලාභ.

නිෂ්පාදනය ඃ ව්‍යාපාරික ආයතන සිද්ධාන්තය, නිෂ්පාදන කළමනාකරණය පිළිබඳ සාධක, ප්‍රාග්ධනය යොදා ගැනීම, ස්ථාවර සහ ජංගම වත්කම්, නිෂ්පාදනය හා බෙදා හැරීම සඳහා සංවිධානය, කර්මාන්ත පිහිටුවිය යුතු ස්ථාන, ශ්‍රම විභජනය සහ විශේෂ වෙළඳ ව්‍යාපාර සංවර්ධනය, සාධක අනුරක්ෂණය හා සාපේක්ෂ වාසි ජනසතු කිරීම.

මුදල් ඃ බැංකු ව්‍යාපාර, ණය සහ මූල්‍ය, මුදල්වල කාර්යයෝ, මුදල් වර්ග, බැංකු ක්‍රමය, මහ බැංකුව, එංගලන්ත බැංකුව, වාණිජ බැංකු, වාණිජ ආයතන, වට්ටම් ආයතන, කුලීපිට ගැණුම්, ජීවිත රක්ෂණය, අර්ථසාධක අරමුදල, විශ්‍රාම වැටුප් අරමුදල, ප්‍රාග්ධන වෙළඳපොළ.

*වෙළඳපොළවල් ඃ ප්‍රාදේශීය, ජාතික හා අන්තර්ජාතික වෙළඳාම, තීරු බදු සහ සලාක.*

අන්තර්ජාතික වෙළඳාම ඃ ජාත්‍යන්තර වෙළඳ සිද්ධාන්තය, රන් මිණුම සහ ඊට පසු ඇති වූ ක්‍රම, රන් පවුම් කලාපය, දුලබ මුදල් කලාපය, අන්තර්ජාතික මූල්‍ය අරමුදල, ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික බැංකුව (ලෝක බැංකුව) සහ අන්තර් ජාතික මූල්‍ය සංස්ථාව, අන්තර් ජාතික සංවර්ධන සංගමය, ආසියානු සංවර්ධන බැංකුව, වෙළඳාම සහ තීරු බදු පොදු සම්මුතිය, යුරෝපා ආර්ථික සංගමය, ද්විපාර්ශ්වික වෙළඳාම, සැපයුම් ණය, විදේශ ආධාර හවුල.

ජාතික ආදායම සහ ආණ්ඩුවේ මැදිහත්වීම ඃ- ජාතික ආදායම මැනීම සහ සංඛ්‍යා දත්ත, ආණ්ඩුව සතු කාර්යභාරය, රටේ ආර්ථික සංවර්ධනය, ඉතිරි කිරීම් සහ අයෝජන, ව්‍යාපාර කාර්ය මට්ටමේ වෙනස්වීම්, සේවා වියුක්තිය, ගෙවුම් ශේෂය සහ රුපියලේ අගය ස්ථිරතාව, උද්ධමනයේ සහ අවධමනයේ ප්‍රතිඵල, ණය මැවීම සහ මහ බැංකුවේ පාලනය, විදේශ වෙළඳාමේ සහ අන්තර්ජාතික තරඟයේ බලපෑම, වෙළඳ ගෙවීම් සහ ගිවිසුම්, අනුලම්භන ණය, තීරු බදු සලාක, ආනයන පාලනය, විනිමය පාලනය, අර්ථ ක්‍රමය විධිමත් කිරීමට ආණ්ඩුව යොදා ගන්නා වෙනත් මාර්ග.

බදු අයකිරීමේ සිද්ධාන්ත සහ මූල්‍ය ප්‍රතිපත්තිය ඃ සෘජු අයබදු, වක්‍ර අයබදු, බදු අය නොවන ආදායම්, සහනාධාර, අයබදු ක්‍රමය මඟින් ආර්ථික පෙළඹවීම සඳහා විධිවිධාන යෙදීම, අයබදු පරිපාලනයේ වියදම්.

රජයේ අයවැය ලේඛනය සඳහා මූල්‍ය ප්‍රතිපාදන මාර්ග ඃ අයබදු සහ බදු නොවන ආදායම, රුපියල් ණය, විදේශීය ණය, කොළඹ ක්‍රමය සහ එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන යටතේ ලැබෙන ආධාර, ආධාර ලැබෙන වෙනත් මාර්ග.

(vi) සාමාන්‍ය වාණිජ දැනුම හා වාණිජ අංක ගණිතය ඃ පහත සඳහන් මාතෘකා ආශ්‍රිත පැය 3 ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.)

ව්‍යාපාර සංවිධානය සහ කළමනාකරණය - තනි වෙළෙන්දෝ, හවුල් ව්‍යාපාර, බද්ධ ව්‍යාපාර වස්තු, වෙළඳ සාමගම්, පෞද්ගලික හා පොදු වෙළෙඳ සමාගම්, රාජ්‍ය සංස්ථා, සමූපකාර සමිති, පළාත් පාලන බල මණ්ඩලය.

ගනුදෙනු කළ හැකි ලේඛන - මුදල් ලැබෙන මාර්ග, ස්ථිර ප්‍රාග්ධනය, කාර්ය ප්‍රාග්ධනය, කෙටිකාලීන හා දිගුකාලීන ණය ගැනීම, මූල්‍ය ආයතන සහ ඒවායේ කාර්යයෝ.

*විදේශීය වෙළඳාම, භාණ්ඩ වෙළඳපොළවල් ඃ*

ව්‍යාපාර රක්ෂණය ඇතුළුව රක්ෂණ මූලධර්ම, ව්‍යාපාර වස්තු හා කොටස්, සුළු පොළිය සහ වැල් පොළිය, සාමාන්‍යයන් සහ මධ්‍යකයන්, සමීකරණ, ඒකජ සමීකරණ, වර්ගජ සමීකරණ සහ ඒවායේ ප්‍රස්තාරික ඉදිරිපත් කිරීම.

(vii) ආණ්ඩුවේ මුදල් රෙගුලාසි සහ මුදල් කාර්ය පරිපාටිය - පහත සඳහන් මාතෘකා ආශ්‍රිත පැය 3 ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.)

ආදායම සහ වියදම, වාර්ෂික ඇස්තුමේන්තු ගත පරිපූරක ඇස්තමේන්තු, ණය අරමුදල්, රාජ්‍ය ණය ආයතන, ගබඩා සහ ටෙන්ඩර්, අග්‍රිම සහ අත්තිකාරම්, මුදල් අනුමැති, දිවයිනේ ගිණුම්, ශ්‍රිත හා ආර්ථික වර්ගීකරණය, වැඩසටහන් අයවැය ලේඛන සහ කාර්යසාධන අයවැය ලේඛන යන මේවා කෙරෙහි ද, මුදල් ආමාත්‍යවරයාගේ, භාණ්ඩාගාරයේ, ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ, ස්ථිර ලේකම්වරුන්ගේ, ඇස්තමේන්තු කමිටුවේ, විගණකාධිපතිගේ සහ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ කාර්යයන් කෙරෙහි ද ආණ්ඩුවේ මුදල් රෙගුලාසි සහ මුදල් කාර්ය පරිපාටිය සම්බන්ධ වන ආකාරය පිළිබඳ සාමාන්‍ය දැනුමක්.

08. *සම්මුඛ පරීක්ෂණය* :

ලිඛිත පරීක්ෂණය එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% කට නොඅඩුව සහ මුළු ලකුණු සංඛ්‍යාවෙන් 45% කට නොඅඩුව ලකුණු ලැබූ අයදුම්කරුවන් අතුරින් ඉහළම මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත් අයදුම්කරුවන් (පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක්) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂා කෙරේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ අයදුම්කරුවන්ගේ සහතික හා තනතුර සඳහා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමක් සිදු නොකෙරේ.

09. *විභාග කොන්දේසි* :-

(i) *විභාග ගාස්තු* :

මේ සඳහා විභාග ගාස්තුව රු. 500 ක් වන අතර, විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර කරන ලෙසට උපදෙස් සහිතව ඉල්ලුම්පත්‍රය භාර ගන්නා අවසාන දිනට ප්‍රථම දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුය. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ඉල්ලුම්කරුගේ නමින් ලබා ගත් කුවිතාන්සිය තම ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක් ඇලවිය යුතුය. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) *ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම* :

(අ) මෙම නිවේදනයට යාකොට ඇති ආකෘතිය ප්‍රකාරව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් 2014 සැප්තැම්බර් මස 12 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කවර ඉල්ලුපතක් වුවද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා සේවයේ නියුක්ත ඉල්ලුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "විවෘත තරඟ විභාගය", විගණන අධිකාරී - 2014" ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ඈ) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් පිරිවිය යුතුය.

(ඉ) ඉල්ලුම් පත්‍රය ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවටද, 07 සිට 09 තෙක් දෙවන පිටුවටද, ඉතිරිය 3, 4 වන පිටුවලටද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වේ.

(ඊ) ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(උ) අත්සන සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් අයදුම්කරුවන් අත්සන සහතික කළ යුතුය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙක් ලවා ද, අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුම්රුම් කොමාසරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, රාජ්‍ය හෝ අධ්‍යක්ෂ පාලිත පාසැලක ප්‍රධානියෙකු රු. 240,360 ක් හෝ එයට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු යන අය අතරින් කවරකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

10. *විභාගයට ඇතුළත් කර ගැනීම* :-

(අ) නියමිත පරිදි ඉල්ලුම් පත්‍ර එවන ලද අයදුම්කරුවන් වෙත විභාග කොමාසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2, 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම්, ඔබගේ එම විස්තර සමඟ ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකරමින්ම විමසා සිටීම ද සුදුසු වේ. එසේ විමසීමේදී අවශ්‍ය විටෙක ඉදිරිපත්

කිරීම සඳහා ඔබ ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද සූදානම් කොට තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථානය භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවෙකු වේතොත් ඔහුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) සාමාන්‍ය *ගැසට් පත්‍රයේ* I කොටසේ (II අ) ඡේදයෙහි පළ කර ඇති විභාග අපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු නීති මාලාවන් කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

(ඇ) විභාගය සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඈ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පහත සඳහන් ලියවිලි පමණකි.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(ඉ) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකේ.

(ඊ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(උ) ඉහත 08 ඡේදයට අනුව සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඇතුළත් මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ලේකම් රාජ්‍ය සේවා කොමිෂම වෙත ලබාදෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results. exams.gov.lk වෙබ් අඩවියේ පල කිරීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ඇත.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා විගණන සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාවට හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

12. අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම්, ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13. පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ලම හෝ පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

14. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් හෝ නොගැලපීමක් පවතී නම් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කිරීමට මැනවි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එච්. ඒ. එස්. සමරවීර,
විගණකාධිපති.

2014 ක් වූ අගෝස්තු මස 01 වැනි දින,
බත්තරමුල්ල,
පොල්දූව පාර,
අංක : 306/72,
විගණකාධිපති දෙපාර්තමේන්තුවේ දී ය.

| |
|---|
| |

(කාර්යාල ප්‍රයෝජනය පිණිසයි)

**ආදර්ශ අයදුම් පත්‍රය**

***ශ්‍රී ලංකා විගණන සේවයේ II පන්තියේ II වැනි ශ්‍රේණියේ විගණන අධිකාරිවරුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014***

Open Competitive Examination for Recruitment of Superintendents of Audit Class II Grade II of the Sri Lanka Audit Service - 2014

| *ගැසට් නිවේදනයේ* 06 වන ඡේදයට අනුව විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.) (සිංහල-2/දෙමළ-3/ඉංග්‍රීසි-4) (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) | ඔබ අයදුම් කරන්නේ *ගැසට් නිවේදනයේ* 02(ආ) (1) සිට (8) තෙක් ඡේද යටතේ නම් 1 ද, 02(ආ) (9) සිට (12) තෙක් ඡේද යටතේ නම් 2 ද, කොටුව තුළ ලියන්න. |
|---|---|
| ☐ | ☐ |

01. නම :

1.1 මුලකුරු සමඟ නම මුලකුරු අගට යොදා (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උදා : GUNAWARDHANA, M. G. B. S. K.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.2 දුරකථන අංකය :————.
2.3 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය එවනු ලබන්නේ මෙම ලිපිනයටයි) :————.

2.4 රාජකාරි ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථාවක

සේවයේ නියුක්ත නිලධාරියෙකු ඔහුගේ රාජකාරි ලිපිනය ලිවිය යුතුයි.)

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී - 1, පුරුෂ - 0)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) [ ]

04. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

05. ජනවර්ගය :
(සිංහල - 1 දෙමළ - 2 ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4
වෙනත් - 5 (අදාළ අංකය කොටුව තුළ ලියන්න) [ ]

06. 6.1 විවාහක/අවිවාහක බව : (විවාහක - 2, අවිවාහක - 1)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.) [ ]

6.2 උපන් දිනය :

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

6.3 2014 සැප්තැම්බර් මස 12 වැනි දිනට වයස

අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

07. *ගැසට් නිවේදනයේ* 02 (ආ) (1) සිට (8) තෙක්වූ ඡේද යටතේ මෙම විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් පහත විස්තර සපයන්න.

මෙම විභාගයට පෙනී සිටීම සඳහා හිමිකම් ලැබීමට ඔබ ලබා ඇති සුදුසුකම සඳහන් කරන්න.

| (1)<br>*ලබා ඇති සුදුසුකම* | (2)<br>*එම සුදුසුකම ලබාගත් දිනයන්* | (3)<br>*එම සුදුසුකම ලබාගත් ආයතනය* |
|---|---|---|
| | | |

08. *ගැසට් නිවේදනයේ* 02(ආ) (9) සිට (12) තෙක් වූ ඡේද යටතේ මෙම විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් පහත විස්තර සපයන්න.

(i) ඔබ අයත් වන සේවාව/දෙපාර්තමේන්තු ශ්‍රේණිය :————.
(ii) එම සේවාවට/දෙපාර්තමේන්තු ශ්‍රේණියට ස්ථිරව පත් කරනු ලැබූ දිනය :—————.

අවුරුද්ද :—————. මාසය :—————. දිනය :——————.

(iii) 2014 සැප්තැම්බර් මස 12 වැනි දිනට පැවති මුළු ස්ථිර හා අඛණ්ඩව සේවාව
අවුරුදු :—————. මාස :—————. දින :———.

(iv) දැනට සිටින පන්තිය/ශ්‍රේණිය :—————.

(v) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු නම් පහත සඳහන් විස්තර සඳහන් කරන්න.

(අ) උපාධිය ලත් වර්ෂය :—————.
(ආ) විශ්ව විද්‍යාලය :—————.
(ඇ) විෂයයන් :—————.
(ඈ) පන්තිය :—————.
(ඉ) ඉහළ/පහළ :—————.
(ඊ) ප්‍රතිඵල පිටවූ දිනය :—————.

(vi) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ මධ්‍ය පරීක්ෂණය සමත් වූ දිනය :———————.

09. මුදල් කුවිතාන්සිය නොගැලවෙන ලෙස අයදුම්පත්‍රයට අලවන්න.

[ ]

(i) අංකය :—————. (ii) මුදල් ගෙවූ ස්ථානය :————.
(iii) දිනය :—————. (iv) ගෙවන ලද මුදල (රුපියල්) :——————.

(මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් තබා ගැනීම පසු විපරම් කිරීමක දී වැදගත් වේ.)

10. *අයදුම්කරුගේ සහතිකය :*

10.1 මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙම විභාගය වෙනුවෙන් ගාස්තුව ගෙවන ලද අංක ……… හා ……… දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන විභාග නීතිරීති අනුව ක්‍රියා කිරීමට එකඟ වෙමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව මෙගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම යටත් වෙමි.

10.2 මෙම කොටස *ගැසට් නිවේදනයේ* 02(ආ) (9) සිට (12) යටතේ වන සුදුසුකම් ඇති අයදුම්කරුවන් විසින් පමණක් සම්පූර්ණ කළ යුතුය.

2014 සැප්තැම්බර් මස 12 වැනි දිනට පූර්වාසන්නයෙන් වූ පස් අවුරුද්දක් තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් මම ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

11. අත්සන සහතික කිරීම 02(ආ) (9) සිට (12) යටතේ සුදුසුකම් ඇති අයදුම්කරුවන් සඳහා පමණි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (ඉහත 10.2 ඡේදය අදාළ වන හා දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන විවෘත තරඟ විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සඳහා)

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ………… නැමැති අයදුම්කරු ……………… වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්, ඉහත 08 හා 10.2 වගන්තිවල සඳහන් කර ඇති විස්තර සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකව පරීක්‍ෂා කර බැලූ

බවත්, ඒවා නිවැරදි බවත්, 2014 ……… මස ……… වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(රබර් මුද්‍රාවකින් සනාථ කරන්න.)

12. අත්සන් සහතික කිරීම 02(ආ) (01) සිට (08) යටතේ සුදුසුකම් ඇති අයදුම්කරුවන් සඳහා පමණි.) *ගැසට් නිවේදනයේ* 09(II) (උ) ඡේදය බලන්න.

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ………… නමැති අයදුම්කරු මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන සහ මුද්‍රාව.

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

08-662/2

---

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

## ශ්‍රී ලංකා විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරිවරුන් බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය - 2014

ශ්‍රී ලංකා විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරිවරුන් බඳවා ගැනීම සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පැවැත්වෙන සීමිත තරඟ විභාගය 2014 නොවැම්බර් මාසයේ දී විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලැබේ.

01. ශ්‍රී ලංකා විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50%කට නොවැඩි සංඛ්‍යාවක් වූ පුරප්පාඩු වන 40 ක ප්‍රමාණයක් පහත 02 හි සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් ලිඛිත පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එහි ප්‍රතිඵල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පුරවනු ලැබේ.

02. සුදුසුකම් .- 2014 සැප්තැම්බර් 12 වැනි දිනට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වසර 10 ක අඛණ්ඩ සේවාවක් ඇත්තා වූ පහත සඳහන් නිලධාරීන්ට පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකිය.

(අ) විගණන පරීක්ෂක සේවයේ I ශ්‍රේණියේ හා II ශ්‍රේණියේ නිලධාරීන්,
හෝ
(ආ) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ, I පන්තියේ හෝ II පන්තියේ රු. 15, 610 කට නොඅඩු මාසික ඒකාබද්ධ වැටුපක් ලබන්නා වූ නිලධාරීන්.

03. *වැටුප් පරිමාණය* .- මෙම තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුප් ක්‍රමය එස්එල්-1 රු. 22,935-10 x 645 - 8 x 790 - 17x1,050 - රු. 53,555 ක් වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව වැටුප් ගෙවනු ලැබේ.

04. *වයස් සීමාව* .- සීමිත බඳවා ගැනීම සඳහා වයස් සීමාව බලනොපානු ඇත.

05. *කායික යෝග්‍යතාව හා අනෙකුත් සේවා කොන්දේසි* .-

(අ) සෑම අයදුම්කරුවකුම යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය,
(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය,
(ඇ) මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව සේවයට බැඳී අදාළ පරිදි දෙවන භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය,
(ඇ) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් වන අතර, එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

06. *විෂය නිර්දේශය* .-

*ලිඛිත පරීක්ෂණ පරිපාටිය* :

(I) *ගණකාධිකරණය* : පහත සඳහන් මාතෘකා ආශ්‍රිත පැය 3ක එක් ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

ගණකාධිකරණ න්‍යාය, නිෂ්පාදන ගිණුම්, වෙළඳ ගිණුම්, ලාභාලාභ ගිණුම් හා ශේෂ පත්‍රය, අවිනිශ්චිත ගිණුම් හා වැරදි නිවැරදි කිරීම, තනි සටහන් ක්‍රමය සහ අසම්පූර්ණ වාර්තා, එකතු ගිණුම් (පාලන ගිණුම්), තොග ඇගැයුම්, ලැබීම් හා ගෙවීම් ගිණුම්, ආදායම් හා වියදම් ගිණුම්, මුදල් පදනම හා උපචිත පදනම ප්‍රාග්ධන හා අයභාර වියදම්, ක්ෂය, ක්‍රමක්ෂය හා හායනය, හවුල් ව්‍යාපාර ගිණුම්, ප්‍රතිපාදන හා සංචිත, බද්ධ ව්‍යාපාර, විනිමය බිල්පත්, සීමිත සමාගම්, රාජ්‍ය සංස්ථා ගිණුම්, නියෝජන ගිණුම්, විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත බඩු යැවීම, හිස් බඳුන් ගිණුම්, ශාඛා ගිණුම්, වෙළඳාංශ ගිණුම් (දෙපාර්තමේන්තු ගිණුම්), කුලී පිට ගැණුම් ගිණුම්, ආයෝජන ගිණුම් සහ පුරස්කාර ගිණුම්.

(II) *විගණනය* : පහත සඳහන් මාතෘකා ආශ්‍රිත පැය 3ක එක් ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සිල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

*විගණනය පිළිබඳ පොදු සිද්ධාන්ත සහ මූලධර්ම* :

*විගණන වර්ගීකරණය* : අභ්‍යන්තර සහ බාහිර, ව්‍යවස්ථාපිත සහ පෞද්ගලික, ශේෂ පත්‍ර විගණනය, අතුරු හා අවසාන විගණනය, රාජ්‍ය විගණනය සහ පෞද්ගලික ව්‍යාපාර විගණනය.

බාහිර විගණකවරයාගේ සහ අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යභාරය, ඔවුන්ගේ සම්බන්ධතාව, පෞද්ගලික ගුණාංග, ස්වාධීනත්වය.

*අභ්‍යන්තර පාලනය සහ පරීක්ෂාව* : අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය, සටහන් තැබීම, ප්‍රාරම්භක ඇගැයුම්, තහවුරු කිරීම හා අවසාන ඇගැයුම, විශ්ලේෂණ විගණනය, සංවිධාන සටහන් හා ප්‍රවාහ සටහන් ගැඹුරින් විගණනය.

*සන්නිරීක්ෂණය* : ප්‍රාග්ධන හා අයභාර වියදම් සහ ආදායම් හා වියදම් වර්ග කිරීම, නියැදි ක්‍රම සහ ශිල්ප ක්‍රම, වංචා සහ වැරදි සොයා ගැනීම සහ වැළැක්වීම.

*විකුණුම් විගණනය* : ණයගැති සහ ලැබීම් කාර්ය පරිපාටිය, ණයට ගැණුම් හා ගෙවීම් කාර්ය පරිපාටිය, පඩි ලැයිස්තු කාර්ය පරිපාටිය, පිරිවැය සහ ඉන්වෙන්ට්‍රි වාර්තා, ගිණුම් පොත්පත්, අතුරු හා අවසාන ගිණුම්.

*වත්කම් සහ බැරකම් සත්‍යාපනය* - ස්ථාවර වත්කම් ආයෝජන, තොග, ණය ගැතියෝ, මුදල්, බැරකම්, අසම්භාව්‍ය බැරකම් යන මේවා පිළිබඳ අයිතිය, පැවැත්ම හා ඇගැයුම

*සීමිත සමාගම්* : සීමිත සමාගම්වල ව්‍යවස්ථාපිත පොත්, අධ්‍යක්ෂකවරුන්ගේ බලතල සහ කාර්යයන්, බෙදිය හැකි ලාභ.

*රාජ්‍ය සංස්ථා* : විගණකයින් පත් කිරීම, ගාස්තු සහ ඉවත් කිරීම, අළුත් විගණනයක් පිළිගැනීමට පෙර ගත යුතු ක්‍රියාමාර්ගය, විගණකගේ බලතල, කාර්යයන් සහ වගකීම්.

අභ්‍යන්තර හා බාහිර විගණන සංවිධානය කිරීම සහ පාලනය - විගණන වැඩසටහන්, අභ්‍යන්තර පාලන ප්‍රශ්න මාලා සහ සිතියම් සටහන්,

*යාන්ත්‍රික ගිණුම්කරණ පද්ධති විගණනය* :
අභ්‍යන්තර විගණනය , කාර්යක්ෂමතා විගණනය, කළමනාකරණ විගණනය, මෙහෙයුම් විගණනය, පද්ධති විගණනය, මුදලට අගය විගණනය.

*විමර්ශනය* :

(III) *ව්‍යාපාර ගණිතය* : පහත සඳහන් මාතෘකා ආශ්‍රිත පැය 3ක එක් ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*ශ්‍රේණි* : සමාන්තර ශ්‍රේණි, ගුණෝත්තර ශ්‍රේණි, ද්විපද සහ ඝාතිය ශ්‍රේණි, වැල් පොලිය සහ වට්ටම් පිළිබඳ සූත්‍ර සහ ඒවා ලබා ගන්නා අන්දම

*සමීකරණ* : ඒකජ සමීකරණ සහ වර්ගජ සමීකරණ හා ඒවායේ ප්‍රස්තාරික සමක, එම සමීකරණ ලබා ගැනීම සහ උපරිම හා අවම ලක්ෂ්‍ය විසඳීම් සඳහා ඒවා යොදා ගැනීම.

*දත්ත* : දත්ත එක්රැස් කිරීම සහ වර්ග කිරීම සන්නිරීක්ෂණය සහ නිරවද්‍යතාවයේ සීමා, වෙළඳපොළ පර්යේෂණ සහ දත්ත එක් රැස් කිරීම.

*ඉදිරිපත් කිරීම* : වාර්තා සකස් කිරීමේ දී සංඛ්‍යාලේඛන භාවිතා කිරීම, සංඛ්‍යාන තොරතුරු විශ්ලේෂණය කිරීම සහ ශිල්පීය නොවන භාෂාවෙන් ඒවා තේරුම් කර දීම, ලඝුගණක ප්‍රස්තාර ඇතුළු ප්‍රස්තාර සහ රේඛා චිත්‍ර.

එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100 ක් බැගින් වේ.

07. *සම්මුඛ පරීක්ෂණය* .- ලිඛිත පරීක්ෂණයෙන් එක් ඒක ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% කට නොඅඩුව ලබා මුළු ලකුණු සාමාන්‍ය 45%ට නොඅඩුව ලැබූ අයදුම්කරුවන් අතුරින් ඉහළම මුළු ලකුණු ලබාගත් අයදුම්කරුවන් (පුරප්පාඩු සංඛ්‍යාවට සමාන ප්‍රමාණයක්) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් සම්මුඛ පරීක්ණයට භාජනය කෙරේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ අයදුම්කරුවන්ගෙන් සහතික සහ මනා සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා පමණක් වේ.

08. *විභාග කොන්දේසි* .-

(I) *විභාග ගාස්තු* : මේ සඳහා විභාග ගාස්තුව රු. 1,000 ක් වන අතර, විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර කරන ලෙසට උපදෙස් සහිතව ඉල්ලුම් පත්‍රය භාර ගන්නා අවසාන දිනට ප්‍රථම දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුය. ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ඉල්ලුම්කරුගේ නමින් ලබා ගත් කුවිතාන්සිය තමඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක් ඇලවිය යුතුය. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(II) *ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම*.-මෙම නිවේදනයට යාකොට ඇති ආකෘතිය ප්‍රකාරව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් 2014 සැප්තැම්බර් මස 12 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ විගණකාධිපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත්, එදිනට පෙර ප්‍රධාන කාර්යාලයේ තැපැල් ශාඛා කවුන්ටරයට භාර දිය යුතුය. මෙදනට පසුව ලැබෙන කවර ඉල්ලුම්පතක් වුවද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවදටද, 06 සිට 09 තෙක් දෙවන පිටුවටද, ඉතිරිය 3, 4 පිටුවලටද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න විමසා බැලිය යුතු අතර, එසේ නොවුනහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වේ.

ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

09. *විභාගයට ඇතුළත් කර ගැනීම* .-

(අ) ඉල්ලුම්පත පිළිගනු ලැබූ සියළුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස්ජනරාල් විසින් ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2, 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම්, ඔබගේ එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීමද සුදුසු වේ. එසේ විමසීමේ දී අවශ්‍ය විටක ඉදිරිපත් කිරීම සඳහා ඔබ ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේ ලියාපදිංචි කළ කුවිතාන්සියද සූදානම් කොට තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථානය භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවකු වෙතොත් ඔහුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(ආ) සාමාන්‍ය ගැසට් පත්‍රයේ I කොටසේ (II අ) ඡේදයෙහි පළ කර ඇති විභාග අපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු නීති මාලාවන් කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

(ඇ) විභාගය සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(ඈ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂයාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පහත සඳහන් ලියවිලි පමණකි.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(ඉ) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

(ඊ) විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(උ) ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ, පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය, ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පලකිරීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ඇත.

10. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා විගණන සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

11. අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම්, ඔහු රජයේ සේවයෙන් පහකිරීමට ඉඩදෙනු ඇත.

12. පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ලම හෝ පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ

රාජ්‍යසේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්. ඒ. එස්. සමරවීර,
විගණකාධිපති.

2014 අගෝස්තු මස 01 වැනි දින,
බත්තරමුල්ල,
පොල්දූව පාරේ,
අංක 306/72,
විගණකාධිපති දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***ශ්‍රී ලංකා විගණන සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ විගණන අධිකාරිවරුන් බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2014***

Limited Competitive Examination for Recruitment of Superintendents of Audit Class II Grade II of the Sri Lanka Audit Service - 2014

[ ]

(කාර්යාල ප්‍රයෝජනය පිණිසයි)

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (i) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උදා : GUNAWARDHANA, M. G. B. S. K.

(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. (i) දැනට සිටින ශාඛාව සහ ලිපිනය :————.
(ලිපිනය වෙනසක් වුනි නම් වහාම දැන්විය යුතුය) :————.

(ii) දුරකථන අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

03. ස්ත්‍රී/පුරුෂ භාවය (ස්ත්‍රී - 1, පුරුෂ - 0) [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

05. (i) ඔබ දැනට අයත් සේවය හා අදාළ වන පරිදි ශ්‍රේණිය, පන්තිය හා බණ්ඩය :————.
(ii) 2014 සැප්තැම්බර් 12 දිනට ඔබේ ඒකාබද්ධ මාසික වැටුප සඳහන් කරන්න :————.
(iii) ඔබ විගණකාධිපති දෙපාර්තමේන්තුවට පත්වීම ලත් දිනය සහ 2014 සැප්තැම්බර් 12 දිනට ඔබ මෙම දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ කර ඇති අඛණ්ඩ සේවා කාලය සඳහන් කරන්න :————.
(iv) ඔබ විගණන පරීක්ෂක සේවයට/රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට ඇතුළු වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය සමත් වූ භාෂා මාධ්‍ය සඳහන් කරන්න :————.

06. අයදුම්කරුගේ සහතිකය

මෙහි සඳහනස් කර ඇති තොරතුරු, මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. විභාගය පිළිබඳව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට

පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ මගේ විභාගපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07. මුදල් කුවිතාන්සිය නොගැලවෙන ලෙස අයදුම්පත්‍රයට අලවන්න. (කුවිතාන්සියේ ඡයා පිටපතක් ළඟ තබා ගන්න.)

(i) අංකය :————. (ii) මුදල් ගෙවූ ස්ථානය :————.
(iii) දිනය :————. (iv) ගෙවන ලද මුදල (රුපියල්) :————.

08. අධීක්ෂණ නිලධාරියාගේ සහතිකය

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ...................... මයා/මිය/මෙනෙවිය මා ඉදිරිපිට දී මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

————,
අධීක්ෂණ නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.

09 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකකය

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ......................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ඉල්ලුම් පත්‍රයේ 04(i), (ii), (iii) සහ (iv) වැනි කොටුවල සඳහන් කර ඇති තොරතුරු මෙහි ඇති වාර්තා අනුව නිවැරදි බවද, අදාළ ගැසට් නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාර ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට යෝග්‍යතාව ලබා ඇති බවද මෙයින් සහතික කරමි.

————,
විගණකාධිපති වෙනුවට.

දිනය :————.

අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට පසුව, විභාගයට පෙනී සිටීමට දක්වා ඇති භාෂා මාධ්‍යයේ වෙනසක් කිරීමට ඉඩදෙනු නොලැබේ.

08-662/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.